# 2015.01.06 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය (-

- ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා — ගරු සභාපති
- කමල් වැල්ලගේ මහතා — ගරු උප සභාපති
- ඒ.පී.ලක්ෂ්මී හේමන්තා සිල්වා මෙනවිය — ගරු නගර සභා මන්ත්‍රී
- එච්.එල්. අනුර කිත්සිරි මහතා — ගරු නගර සභා මන්ත්‍රී
- ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා — ගරු නගර සභා මන්ත්‍රී
- ග්‍රේෂන් කෙරමිණියගේ මහතා — ගරු නගර සභා මන්ත්‍රී
- ඒ. ඩබ්. ජගත් කුමාර මහතා — ගරු නගර සභා මන්ත්‍රී
- ජේ.ඩබ්.හාෂිණි මෙනුකා විජේසූරිය මහත්මිය — ගරු නගර සභා මන්ත්‍රී
- ජේ.ඩබ්.ජයන්ත මහතා — ගරු නගර සභා මන්ත්‍රී
- ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා — ගරු නගර සභා මන්ත්‍රී
- බී.ජනිත් වික්‍රමතිලක මහතා — ගරු නගර සභා මන්ත්‍රී
- කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා — ගරු නගර සභා මන්ත්‍රී

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව.10.00 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී** ☸

## (01)

**01:01 2014.12.02 දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2014.12.02 වන දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ ඒ අනුව **2014 – 12 – 02** දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 2014 – 12 – 17 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2014 – 12– 17 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව කියවුවා සේ සලකා පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ ඒ අනුව **2014 – 12 – 17** දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

➢ **පෙ.ව.10.15 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.හාෂිණී මෙනුකා විජේසූරිය මහත්මිය සභාවට පැමිණෙන ලදී.**

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** ' සංවර්ධන සැලැස්ම - 2014 අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හෙප්පුමුල්ල සේවා පියසට ජලය ලබා ගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙප්පුමුල්ල සේවා පියසට ජලය ලබා ගැනීම සඳහා නගර සභාවට අයත් මාර්ග කොටසක් පළුදු කිරීමට සිදු වී ඇති බවත් එම මාර්ග කොටස ගාස්තු අය කිරීමකින් තොරව පළුදු කිරීමට අවසර ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙප්පුමුල්ල සේවා පියසට ජලය ලබා ගැනීම සඳහා නගර සභාවට අයත් මාර්ග කොටස පළුදු කිරීම ගාස්තු අය කිරීමකින් තොරව සිදු කිරීමට අවසර ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

➢ **පෙ.ව.10.20 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ.බඩ්.ජගත් කුමාර මහතා සභාවට පැමිණෙන ලදී.**

**3:2** ' තායිලන්තයේ පළාත් පාලන ආයතන පිළිබඳ අධ්‍යාන චාරිකාව ' මැයෙන් සකුරා සිරිලක් භාරත සංචාරක සංවිධානය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

සකුරා සිරිලක් ආයතනය සහ තායිලන්තයේ ආපදා කළමණාකරන ආයතනය හා එක්ව තායිලන්තයේ පළාත් පාලන ආයතන හා පිළිබඳව හා ආපදා කළමණාකරනයේ හා දේශගුණික විපර්යාස වලදී පළාත් පාලන

ආයතනයන් දැක්විය යුතු සුදානම පිළිබඳව අධ්‍යන චාරිකාව 2014 ජනවාරි මාසයේ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් ඒ සඳහා සභාපතිතුමන්, උපසභාපතිතුමන් සහ මන්ත්‍රීවරුන්ට සහභාගී විය හැකි බවත් මේ සඳහා වැඩසටහන් ගාස්තුව සහ ප්‍රවාහන ගාස්තුව රු.85000.00 ක් බවත් දන්වා තිබුණි. (තරු හතර පන්තියේ හෝටලයක දින 06 ට දිවා සහ උදෑසන ආහාරය සඳහා රු.39000.00 , ක්ෂේත්‍රයේ නැරඹුම් සඳහා ටිකට්පත් ගාස්තුව රු.4500.00,තායිලන්ත ආසියා ආපදා කළමණාකරනයේ පාඨමාලා ගාස්තුව රු.8500.00,ගුවන් ටිකට්පත් සඳහා රු.33000.00)

**<u>ගරු නගර සභා මන්ත්‍රී  බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි, නගරයේ අය බදු ගෙවන ජනතාවගේ මුදලින් නම් මේ විදේශගත වීම සිදු කරන්නේ අපි ඒකට විරුද්ධයි.එහෙම නැතිව රජයේ මුදලින් ,පළාත් සභාව හරහා මෙය සිදු වෙනවා නම් ගැටලුවක් නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි,ජනිත් මන්ත්‍රීතුමා ඉන්න ස්ථාවරයේම තමයි මමත් ඉන්නේ.මොකද අපි ආර්ථිකය අතින් ඉතාම පහත් තත්වයකට වැටිලා ඉන්නේ.ඒක සභාපතිතුමා ,ලේකම්තුමා,ගණකාධිකාරීතුමා වගේම අපිත් දන්නවා.දැනට ලක්ෂ ගාණක් මේ නගර සභාවට ගෙවන්න තියෙනවා.ඔබතුමා තවම පොත් වල සල්ලි දුන්නද මං දන්නෑ.ලක්ෂ දහඅටහාමාරක් එතන.ෂෙඩ් එකෙන් සමූපකාරෙන් අපට කියනවා ලක්ෂ ගාණක් එන්න තියෙනවා කියලා.ඊලඟට පුවත් පත් දැමීම සම්බන්ධයෙන් ගැටලු පවතිනවා.මාස 06 ක ලක්ෂ 02 ක ගාණක් ගෙවන්න තියෙනවා. ඒ නිසා පත්තර නවත්තලා තියෙනවා.ඒ වගේම තව සැපයුම් කරුවන් කීප දෙනෙක් මාත් එක්ක කීවා ඔවුන්ට මුදල් ලැබෙන්න තියෙනවා කියලා.මගේ දැනුමේ හැටියට ලක්ෂ 50 ක් විතර තියෙනවා.මම ඔබතුමාට හැමදාමත් කීවා මේක සමබරව ක්‍රමාණුකූලව ගෙනියන්න ඕන කියලා.මොකද ආදායම සහ වියදම දිහා බැලුවම බැරි වැඩ කරන්න බැහැ.එහෙම වුනොත් මේක වැටෙනවා.ඒක අනිවාර්යයි.එනිසා මේක සකසුරුවමින් කරන්න ඕන.ඔබතුමා මේ තත්වය දන්නවා.එනිසා මම කියන්නේ දැන්වත් නගර සභාවේ ගෞරවය ආරක්ෂා වෙන විදියට වැඩ කරන්න ඕන.මම නිතරම කියන්නේ පාරවල් ටික පැච් කරලා, පාරවල් ටික සුද්ධ කරලා ,කාණු ටික සුද්ද කරලා ,කුණු ටික බැදලා ,ලයිට් එක දාලා දුන්නම  මිනිස්සු දන්නවා.ඊට වැඩි පුර ලැබුණොත් අපට පුලුවන් ක්‍රීඩා තරඟ තියලා ,පොත් බෙදා දීම් වගේ ඒවා කරන්න. ඒකත් අපි අපි කතා කරලා නෙවෙයි ලේකම්තුමා , ගණකාධිකාරීතුමා එක්ක එකතුවෙලා සැලසුම් සකස් කරලා ඕන කරන්න.අද ඇත්තටම මේ තත්වය උදා වෙලා තියෙන්නේ ඒ හින්දා.නගර සභාවට වරිපනම් ලැබෙන්නෑ 100% ම. අවුරුද්ද අවසානයේ 75% මේක ලැබෙන්නෑ.කඩ බදු නම් ලැබෙනවා තියෙන නීති රීතිත් එක්ක.ඔය දෙකෙන් තමයි අපට වැඩි පුරම ආදායම ලැබෙන්නේ.ඊලඟට වැටුප් ප්‍රතිපූර්නය කරනවා ආණ්ඩුවෙන්.එනිසා ඒවයෙදී අපට ගැටලුවක් වෙන්නෑ.ඔබතුමා මට මොනව කීවත් කමක් නෑ.අපි ඉස්සර තේ එකක් විතරයි මෙතන බිව්වේ.අපි එහෙමයි කළේ.එපාර අපි කාර්යය සාධනයෙන් දිනුවා.ඒකෙන් ලක්ෂ 50 ක් හමුවුණා.ඒකෙන් තමයි මේ වැඩ කළේ.ඒකෙන් අපි 10% ක් දුන්නා සේවකයින්ට අනුමැතියක් අරගෙන.ඒක එහෙම දෙන්න ඕන.මොකද එයාලා නිසා තමයි අපට මේක ලැබෙන්නේ.එදා තත්වයට වඩා අද තත්වය බරපතලයි.මොකද වියදම වැඩී.එදා 1984 තිබ්බ බදු ගෙවන්නන් තමයි අදත් ඉන්නේ.නමුත් එදාට වඩා ඉන්ධන, වතුර බිල්,ලයිට් බිල් සේරම වැඩි වෙලා තියෙනවා.ඉතින් ගෙදරක වුනත් මේ ආයතනයේ වුනත් අපට මේක පාලනය කරන්න බෑ.අපි කඩ බදු වලින් 05% ක් වැඩි කරනවා ,වසර 2-3 කට සැරයක්.මේක මදී.අද තීන්ත ගාන්න ගියත් ,බලන්න එඩ්වින් ස්ටූඩියෝ එක ළඟ ගොඩනැගිල්ල නගර සභා ලාංජනයත් එක්කම පෙද කාලා.හැමෝටම පේනවා ඒක.අපේ පාරක් පැච් කරගන්න බැරිව අපි ඉන්නවා.ගිහින් බලන්න විලේගොඩ පාර.හීන් ඇළ හරස් පාරත් ඒ වගේ.මං හිතන්නේ අනෙක් කොට්ඨාශ වලත් එහෙම ඇති.එතකොට අපි කීවා තමුන්නාන්සේට ජීම් එක දාන කොටත්.ඒ සල්ලි මෙතන තිබුනනම් මේ ණය ටික බේරලා මොනවා හරි කරන්න තිබුණා.අපි විපක්ෂයක් විදියට මේවා කියන්නේ විරුද්ධ වීමක් නෙවෙයි.අපි තමුන්නාන්සේට එදා ඉදලම කීවා මේවා අරපිරිමැස්මෙන් භාවිතා කරන්න ඕන කියලා.මුද්දර ගාස්තු ආවහමත් ඉක්මණින්ම ඉවර වෙනවා.නඩත්තුවට රජයෙන් සල්ලි දෙන්නෑ.ටෙලිෆෝන් බිල්,වතුර බිල්,ලයිට් බිල් ඒවා නඩත්තු කරන්න තියෙනවා.ඔබතුමා බලන්න මාසෙකට අපට ලැබෙන ආදායමයි අපට යන වියදමයි බලනකොට මෙතන වියදම වැඩියි.අපි නම් නගර සභාවේ සල්ලි වලින් මේ වගේ චාරිකා වලට කැමති වෙන්නෑ.මොකද අපි දන්නවා ජනතාව බදු ගෙවන්නේ කෙහොමද කියලා. එනිසා අපි ජනතාවගේ බදු මුදලින් මේ වගේ ගමන් යනවට විරුද්ධයි.ඔබතුමාත් නොකීවට ඔබතුමා දන්නවා මේ දේවල්.ජේම්ස් සිල්වා මහත්තයගේ අන්තිම කාලේ එතුමට

දේශපාලනෙත් එපා වුනේ මේ තත්වය නිසා.තමුන්නාන්සෙත් අද ඒ තත්වයට පත් වෙන්න පුලුවන් සමහර විට.අපට අද වෙනත් ආදායම් නෑ.අද තනායම නෑ,අපට හෝටල් නෑ.නමුත් බලපිටිය වගේ බැලුවොත් ඔවුන්ට හෝටල් වලින් ආදායම ලැබෙනවා.අපි පොඩි සීමාවක හිරවෙලා ඉන්නේ.එනිසා අපි ඔබතුමාට කියනවා මේ වගේ එක එක්කෙනාගේ කීම්වලට මේ වගේ වැඩ කරන්නැතිව තියෙන මුදලකින් එක් කෙනෙකුගේ හරි ණය ටික ගෙවමු කියලා.නගර සභාවේ ගෞරවයත් රැකගෙන මහජනතාවගේ අවශ්‍යතා ටික ඉටුකරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා.මම ප්‍රකාශ කළේ මගේ අදහස.කොහොමත් අපි විපක්ෂයක් විදියට මේ වගේ දේවල් වලට කැමති වෙන්නෑ.ඒක නිසා කැමති කෙනෙකුට කැමති වෙලා යන්න පුලුවන්.අපි ඉන්න මතය තමයි මම ප්‍රකාශ කළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා</u>**

සභාපතිතුමණි ,ජයන්ත මන්ත්‍රීතුමා කීවා වගේ ජනතාවගේ බදු මුදල් වලින් නැතිව රජයේ මුදලින් යනවනම් කමක් නෑ කියලා තමයි මමත් කියන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රජයේ බදු මුදල් කීවත් මහජනතාවගේ මුදලින් තමයි දෙන්නේ. මට මේ ලිපිය ලැබිලා තිබුනා.එකයි මම සභාවට ඉදිරිපත් කළේ.මේකට යනවද නැද්ද කියන එක මන්ත්‍රීවරු තීරණය කරන්න ඕන.මොකද මට තනිවම තීරණය කරන්න බැරි ලිපි මම තමුන්නාන්සේලාට ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මේ චාරිකාව සඳහා නගර සභාවෙන් මුදල් වියදම් කළත් ,රජයෙන් මුදල් වියදම් කළත් මෙය ගරු මන්ත්‍රීවරුන්ට අධ්‍යයන චාරිකාවක් සඳහා ලැබෙන්නේ,මෙය රටේම පරිපාලනයට වැදගත් වනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා දැනට අම්බලන්ගොඩ නගර සභාව හැර ගාලු දිස්ත්‍රික්කයේ සියලුම පළාත් පාලන ආයතන මේ චාරිකාව ගිහිල්ලා තියෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ලංකාවේ තියෙන සියලුම රාජ්‍ය ආයතන ,මන්ත්‍රීවරුන්ට විතරක් නෙවෙයි රජයේ නිළධාරීන්ට මේවා නිතිපතා ලැබෙන දේවල්.ඒක රජයෙන් සංතෝසම් ලබා දීමක් නෙවෙයි.අධ්‍යාන චාරිකා කියන්නේ යමක් පිළිබඳ අවබෝධය ලබාගන්න දෙන දෙයක්.හණමිටි අදහස් දරණ සියලු දෙනාටම ඒක ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තියෙනවා.ඒ වගේම නව තාක්ෂණයත් එක්ක අලුත් දේවල් දැන ගැනීමට අවශ්‍යතාවය තියෙන ඕනෑම කෙනෙක් මේ චාරිකාවට එකඟත්වය පල කරනවා.ගැටලුව වෙලා තියෙන්නේ මුදල්.ගරු සභාපතිතුමණි, මේ සභාවේ තත්වය පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරු කියා සිටින්නේ.අපේ ජනිත් මන්ත්‍රීතුමාලා කතා කළ නිසා මම කියන්න කැමති එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුකාලේ මේ නගර සභා පාලනය තුළ සත පහක්වත් ප්‍රතිපාදන විදියට මේ නගර සභාවට ලැබුන්නෑ.ආසනයට ලැබුනෙත් නෑ.ලැබුණනන් සංඛ්‍යා ලේඛන වලින් දෙන්න.මම දන්න ඉතිහාසට තුළ නම් ලැබුනේ නෑ.කලාතුරකින් මට මතකයි වජිර ඇමතිතුමා රු.50000 ක් පුස්තකාලයට එවලා තිබුණා.ඒ හැරෙන්නට මේ නගර සභාවට රජයේ ප්‍රතිපාදන ලැබුනේ නෑ.ඒ වගේ නෙවෙයි දැන්.රජයෙන් ලක්ෂ හාරදාහක් ආසනයට එන කොට එක්දහස් පන්සියයක් පමණ නගර සභාවට එනවා.මේවා ණය නෙවෙයි.කෙලින්ම සංවර්ධන ප්‍රතිපාදන.මේ මුදල් වලින් අපි මේ ආසනයේ සෑම තැනකම අස්සක් මුල්ලක් නැර කොන්ක්‍රීට් කරලා,තාර දාලා,ඉන්ටලොක්ස් අල්ලලා කෙහොම හරි ජනතාවට පරිභෝජනය කරන්න සුදුසු පරිදි සකස් කරලා තියෙනවා.කරුණාකරලා බාධකරන්න එපා මගේ කතාවට.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බාධ කරන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

හීන් ඇළ පාරට මේ සභාවෙන් ලක්ෂ 40 ක් වෙන් කරලා තියෙන්නේ.ඒක කියන්නෑ.නමුත් හීන් ඇළ හරස් පාරේ තියෙන වළ කියනවා.ඒකට හේතුව ගරු මන්ත්‍රීතුමා ගල් රෝල කැඩිලා මාස ගාණක්.ගල් රෝලේ එංජිම හදාගන්න පරක්කු වෙන එක තාක්ෂණික ප්‍රශ්නයක්.මේ සභාවෙම ඔබතුමාලා විරුද්ධ වුණා එංජිමක් ගේනවට.මේවා කාලය යන ප්‍රශ්න.එනිසා අපි කිවුවා මේ එංජිම කොහොම හරි ගෙනල්ලා සවි කරන්න ඉඩ

දෙන්න කියලා.ඒකටත් විරුද්ධ වෙන ගමන් දැන් මෙහෙම කියනවා.තාර තියෙනවා ,ගල් ටික තියෙනවා,රෝල නැහැ.ඉතින් කොහොමද කරන්නේ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මන්ත්‍රීතුමා ගල් රෝල දැන් හදලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**
මේ දේවල් නිසා ප්‍රමාදයක් විතරයි තියෙන්නේ.ඔබතුමාලා විපක්ෂේ වගේම අපි ආණ්ඩුපක්ෂේ මන්ත්‍රීවරු.ඔබතුමාලට එක සැරයක් කියනවනම් අපට තුන් සැරයක් කියනවා, පාර කැඩිලා යන්න බෑ කියලා.මමත් වාහන වල යන කෙනෙක්.මම දිනපතා මේ පාරවල් වල යන කෙනෙක්.එදාට වඩා විශාල සංවර්ධනයක් අද තියෙනවා.බොහොම අඩු පාරවල් කීපයක් විතරයි තව කරන්න කියෙන්නේ.පාරේ පැච් එක විතරක් කතා කරන්න එපා.සංවර්ධනයත් එක්ක කතා කරන්න එහෙනම්.අපි දන්නවා ,ජනතාව පීඩා විඳිනවා.ඒක එහෙමෙයි කියලා නව තාක්ෂණය උගන්වන මේ පාඩමට නොයා ඉන්න එකද කරන්න තියෙන්නේ.ඒක මං මට විරුද්ධ වීමක් වගෙයි.මං මේ කියන් ආවේ නගර සභාවේ මුදල් තත්වය ගැන.එදා මධ්‍යම ආණ්ඩුවෙන් කිසිදු සහනාධාරයක් ලැබුනේ නෑ මේ සභාවට.අද වාහනම කීයක් තියෙනවද නගර සභාවේ.මේ වාහන වල ඉන්ෂුවරන්ස් එක දාන එකත් ගැටලුවක් අද අපට.ඒ තරම් ඉන්ෂුවරන්ස් ගෙවන්න තියෙනවා.එතකොට ආසියානු සංවර්ධන බැංකුවෙන් ගත්ත ලක්ෂ 500 ක ණය මුදල අද වෙන කොට ගොඩක් ගෙවලා ඉවරයි.බස් ස්ටෑන්ඩ් එකේ ව්‍යාපෘතියට ගත්ත ලක්ෂ 500-600 ණය මුදල දැනට ගොඩක් ගෙවලා ඉවරයි.මෙතුමගේ කාලේ මේවා ගෙවුවේ.කවුරුත් සල්ලි එව්වේ නෑ.මේවා සභාවේ සල්ලි වලින් ගෙව්ව නම් සභාව බන්කොලොත් කියන්නේ කෙහොමද.කිසිම දෙයකට හිඟ තියලා නඩු වැටිලා නෑ.මෙතුමගේ කාලේ කිසිම ලෝන් එකකට අපි අත උස්සලා නෑ.ඒ කාලේ ලෝන් කීයක් ගත්තද.අපි හැම ණයක්ම ගෙවමින් මේ එන්නේ.තාවකාලික ප්‍රශ්න ඇති වෙනවා.අපි නෑ කියන්නෑ.ගෙදරක් වුනත් එහෙමනේ.ඕනම ආයතනයක මුදල් ප්‍රශ්න ඇති වෙනවා.ඒවා තාවකාලිකයි.අපි තාවකාලික සේවකයෝ ගන්නවා 100 ගණන්.එයාලව නඩත්තු කරන්න ඕන.පඩි ගෙවන්න ඕන.මේක පොදු සේවා සපයන ආයතනයක් .ලාභ ලබන ආයතනයක් නෙවෙයි.මන්ත්‍රීවරයෙක් හරි නිළධාරියෙක් හරි විදේශ සංචාරයක් යනවා කීවම ඒක තමයි මහ ලොකුවට කතා කරන්නේ.මම තරම් සුදුසු මිනිහෙක් නෑ මේ සභාවේ මේකට විරුද්ධ වෙන්න.මම ගරු සභාපතිතුමණි , මේ දක්වා ගනිපු පඩි සල්ලි රු.5.00 ක් වත් අතින් අල්ලලා නෑ.ඔක්කොම දනට පිනට දීලා තියෙන්නේ හැම ආයතනයකටම.නම් ගම් ඇතිව ඔක්කොම ලිස්ට් එක මං ගාව තියෙනවා.අවුරුදු 4 ක් වැඩිහිටි නිවාසෙට පඩි සල්ලි මම එහෙමම දුන්නා.එහෙමනම් ගරු මන්ත්‍රීතුමන්ලා මේකට විරුද්ධ නම් පඩි සල්ලිත් නොගෙන ඉන්න පුලුවන්නේ.මේ සභාවේ සල්ලිනේ.අහිංසක මිනිස්සුන්ගේ වරිපනම් සල්ලිනේ......කොහොමත් ඒ සල්ලිත් අහිංසක මිනිස්සුන්ගේ තමයි.වරිපනම් බදු ගෙවන්නේ අහිංසක මිනිස්සු තමයි.නැතිනම් වෙන කවුද.ඒ බදු තමයි අපට පඩි සල්ලි වෙලා එන්නේ.වෙන මොන සල්ලිද.ජනාධිපතිතුමාගේ ඇමතිවරුන්ගේ සල්ලි වලින් එවන්නෑනේ.මහජනතාවගේ බදු සල්ලි තමයි මේ එවන්නේ.ගරු මන්ත්‍රීවරුන්ට පෙට්‍රල් දීමනාව දෙනවා.මෝටර් සයිකල් දෙනවා.එහෙනම් ඒවත් ප්‍රතික්ෂේප කරන්න පුලුවන්නේ.මං එතන නෑ.මං ඒවා නොගත්තත් හෙට මන්ත්‍රීවරුන්ට අයි පෑඩ් දෙනවා කීවත් මං එකඟවෙන මනුස්සයෙක්.අපි කන බොන මිනිස්සු.එහෙම ගැටලුවක් ඇති කරගන්න එපා.මේ තාක්ෂණය සම්බන්ධ නව අත්දැකීමක් මන්ත්‍රීවරුන්ට ලැබිච්ච අධ්‍යාපන චාරිකාවක්.ඒ නිසා අපි සාකච්ඡා කරලා ඔබතුමා කියන ආකාරයට අපට බරක් නොවන විදියට ගරු මහ ඇමතිතුමාත් එක්කත් කතා කරලා යම් ක්‍රමවේදයක් ,යම් ආදායමක් ලබා ගන්න එක වෙනම කතාවක්.මේක පටන් ගන්න කොටම විරුද්ධත්වය ප්‍රකාශ කළහම ඒක ගැටලුවක්.සභාව අපහසුතාවයට පත් වෙනවා.පත්තර වල ගියහම වීරයෝ වෙන්න පුලුවන්.වරිපනම් ආදායම අද සභාවේ ආදායමෙන් භාගෙට භාගයක් වත් නෑ.කඩ බදු වගේ ආදායම් වලින් තමයි මේ සභාව දුවන්නේ.මේ සභාවේ යන වියදම් වල හැටියට මන්ත්‍රීවරයෙක්ට, නිළධාරියෙක්ට අධ්‍යාන චාරිකාවක් වෙනුවෙන් මුදලක් වැය කරනවා කියන එක දිහා මෙහෙම බලන්න හොඳ නෑ.ඒක සධාචාර සම්පන්න නෑ.අනෙක් පැත්තට අපි කවුරු වියදම් කළත් ජනතාවගේ මුදල්.ඒ මුදල් වලින් ජනතාවට සේවයක් වෙනවනම් ඒකෙන් අහතියක් වෙන්නේ නෑ.අධ්‍යාන චාරිකාවක් කියන එක කාගෙත් අයිතිය.එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙත් අයිතිය.එතුමන්ලට නැහැ කිවුවනම් මේකට විරුද්ධ වෙන්න සාධාචාර සම්පන්න අයිතියක් තියෙනවා.මම ඉදිරිපත් කළේ මගේ පුද්ගලික අදහස සභාපතිතුමණි.පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ට අයිතියක් තියෙනවා අදහස් දක්වන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**
අධ්‍යාන චාරිකා විතරක් නොවෙයි ,මොනයම්ම හෝ චාරිකාවක් රජයෙන් මන්ත්‍රීවරුන්ට ලැබෙනවනම් ඒ සම්බන්ධයෙන් පක්ෂපාතීත්වය දක්වනවා ගරු සභාපතිතුමණි.අපි මේ ගරු සභාවේ සුරක්ෂිතභාවය පිළිබඳව අපි

අපේ පුද්ගලික ධනය ,ශ්‍රමය,කාලය වැය කරලා මහජන සේවය වෙනුවෙන් කැප වෙච්ච පුද්ගලයෝ.ඒ ආශ්‍රයෙන් අපි සියලු දේ හෘර්ද සාක්ෂියට එකභව කරලා තියෙනවා.අපි පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු කිසි කෙනෙක් මේ සභාවෙන් මුදල් උපයගත්ත අය නෙවෙයි.එනිසා අපි මේ සභාවේ මුදල් එක්ක සෙල්ලම් කරන්නෑ.ආණ්ඩුවේ සල්ලි වේවා, පළාත් සභාවේ සල්ලි වුනත් යම් සමාගමකින් ලැබුණු මුදල් වුනත් විදේශ ආධාර වුනත් අපි විශාල වැඩ කොටසක් එදාට වැඩිය සාපේක්ෂව අද කරනවා.අපි ඕනෑම දෙයක් තෝරා ගැනීමේදී පෙර පැවති දේවල් එක්ක බලලා සාපේක්ෂව තමයි තීරණ ගන්න ඕන.ඒ තත්වයේදී විදේශීය චාරිකා කියන දේ මේ රටට අවශ්‍යයි.විශේෂයෙන්ම පළාත් පාලන මන්ත්‍රීවරුන් විදියට පක්ෂ විපක්ෂ හෝ වේවා සියලුම දෙනාට මේ අධ්‍යන චාරිකා අවශ්‍යයි කියලා මම හිතනවා.ඒ වගේම යම් ආයතනයක ඉන්න නිළධාරීන්ටත් මේ අත්දැකීම අවශ්‍යයි කියලයි මම හිතන්නේ.ඒ තත්වය තුළ ඔබතුමා කියන ආකාරයට ගාල්ල දිස්ත්‍රික්කය තුළ විදේශීය චාරිකාවකට යොමු නොවෙච්ච මන්ත්‍රීවරු කොටසක් ඉන්නවනම් අපි ඒකේ පළමු ගණයේ ඉන්නවා.මම හිතන්නේ ඒක අපේ නොහැකියාව,දුර්වලතාවය කියලා.සමාවෙන්න ඔබතුමාට මම පුද්ගලික අපවාදයක් ඉදිරිපත් කරනවා.ඔබතුමා සමස්ථ ලංකාවේ පළාත් පාලන නියෝජිතයින්ගේ සංගමයේ සභාපතිවරයා විදියට ඉන්න තත්වයකදි මේ සඳහා අපි ප්‍රමාද වැඩියි කියලයි මම හිතන්නේ.මේක සදාකාලික කන්‍යාභාවය වගේ හණමිටි අදහස් තියාගෙන කරන්න බෑ.මේ සියලුම දේවල් වලට යොමු වෙන්න කාලය ඇවිත් තියෙන්නේ.මේ සම්බන්ධ කතා කරන්න ගියෙත් විවාදයකට තුඩු දෙන්න වෙන නිසා,කොහොම වුනත් මධ්‍යම රජයෙන් මේ සඳහා මුදල් ආවත් ,ගරු දකුණු පළාත් ප්‍රධාන ඇමතිතුමා මේ සඳහා මුදල් වෙන් කළත් ,අම්බලන්ගොඩ නගර සභාවෙන් මේ සඳහා මුදල් වෙන් කළත් රටේ මහජන මුදල් තමයි මේ සඳහා වැය කරන්නේ.ලංකාව කියන්නේ මිනිසුන්ට සේවා සපයන රටවල් අතරින් ඉහළින්ම ඉන්න රටක්.ඒ අතරිනුත් අම්බලන්ගොඩ නගර සභාව කියන්නේ දැඩි ලෙස ප්‍රජා සේවා සපයන ආයතනයක්.මෙහිදී ඔබතුමා කළේ මේ සම්බන්ධ අදහස් විමසීමක් පමණයි.මේ සම්බන්දයෙන් මුදල් සොයා ගන්න එක අපි පක්ෂ විපක්ෂ බේදයකින් තොරව සියලු දෙනාම එකතු වෙලා වෙනත් සුභද මාර්ගයකට යමු කියලා මම යෝජනා කරනවා සභාපතිතුමණි.මේ සඳහා මාර්ග කීපයක් තියෙනවා.අපට පුලුවන් මෙය ප්‍රධාන ඇමතිතුමාට කියන්න,ප්‍රදේශයේ ප්‍රාදේශීය වශයෙන් අපට උපකාර කරන සජින් වාස් ගුණවර්ධන මැතිතුමා ඉන්නවා.ඒ වගේම අම්බලන්ගොඩ ප්‍රදේශයේ ඉන්නවා එයාලංකා එකේ වැඩ කරන විධායක නිළධාරීන් කීප දෙනෙක්ම.මේ වගේ සම්පත්දායකයින් අපට ඉන්නවා.අපිත් කැමති නෑ අම්බලන්ගොඩ නගර සභාවේ මුදල් මේ දේවල් සඳහා වැය කරන්න.ඔබතුමා මේ සම්බන්ධ අදහස් විමසීමක් විතරයි කළේ.එනිසා මේ සම්බන්ධයෙන් මගේ පක්ෂපත්‍රාහිකත්වය ප්‍රකාශ කරමින් මම නිහඩ වෙනවා.

➢ **පෙ.ව.10.44 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා සභාවට පැමිණෙන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේවී රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**</u>

මන්ත්‍රීවරුන් සියලු දෙනාටම ප්‍රථමයෙන් සුභ අලුත් අවුරුද්දක් වේවායි සුභ පතනවා.මේ විදේශ සංචාරය සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් අදහස් දැක්වුවා.පක්ෂයේ මන්ත්‍රීවරුන් දක්වපු අදහස් වලට මම එකඟයි.විපක්ෂ නායකතුමාගේ අදහස වුනේ නගර සභාවක් විදියට අපි මූල්‍යමය අර්බුදයක ඉන්න වෙලාවක මේ දේ කළ නොහැකී කියලා.අපි දන්නවා ගිය වර පාසල් පොත් බෙදා දුන්නා.නමුත් මේ වසරේ අපට එය ඉටු කර ගන්න බැරි වුණා.නගරයේ දෙමව්පියන් ළමුන් මන්ත්‍රීවරුන්ගෙන් අහනවා ඇයි මේ පොත් ලබා නොදුන්නේ කියලා.අපට බැරි වුණා ගිය වර පොත් වල මුදල් ලබා දෙන්න.ගිය අවුරුද්දේ අපි ලෝක ළමා දිනයක් පැවැත්වුවා.එත් මෙවර එය පවත්වන්න බැරි වුණා.ඉතින් අපට පිළිගන්න වෙනවා අපි යම් මූල්‍ය අර්බුධයක ඉන්නවා කියලා.මේක දීර්ඝ කාලීන එකක් නොවන්න පුලුවන්.එනිසා සභාවේ මුදල් මේ සඳහා වියදම් කිරීමට මමත් විරුද්ධයි.නමුත් කිත්සිරි මන්ත්‍රීතුමා යෝජනා කළා මේ සඳහා යම් පුද්ගලයකුගෙන් ,යම් ආයතනයකින් අපට උදව් ලබා ගැනීමේ හැකියාවක් පවතිනවා කියලා.අපි ප්‍රාදේශීය මන්ත්‍රීවරු විදියට ඉදිරියටත් දේශපාලනයේ ඉන්නවනම් මේ වගේ අධ්‍යන චාරිකා ,ලෝක දේශපාලනය ගැන දැන ගැනීමේ අවස්ථාවන් සියලුම දෙනා විසින් පිළිගත යුතුයි කියන තැන මම ඉන්නවා.අපට ගැටලුව වෙන්නේ මේ අවස්ථාවේදී මේ සඳහා සභාවේ මුදල් වැය කිරීම සම්බන්ධවයි. එනිසා මම කිත්සිරි මන්ත්‍රීතුමා කියපු කතාවත් සමඟ එකඟයි.එතුමා කිවුවා වගේ අපට පුලුවන් නම් මහ ඇමතිතුමාගෙන් හරි මේ ප්‍රදේශය නියෝජනය කරන වෙන යම් කෙනෙක් ගෙන් හරි මේ සඳහා අනුග්‍රහයක් ලබා ගන්න එහි කිසිම ගැටලුවක් නෑ සභාපතිතුමණි.ඒ වගේම තම දැනුම වර්ධනය කර ගැනීමට මන්ත්‍රීවරුන්ට තියෙන අවස්ථාව අපි අහිමි කිරීමත් සුදුසු නෑ කියලා මම කියනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නගර සභාවට යම් කිසි ලිපියක් ලැබුණහම ඒක සභාවට යොමු කරලා මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසලා ඒ අනුව තමයි අපි කටයුතු කරන්නේ.ඒ නිසා තමයි මේ ලිපියත් යොමු කළේ .අපි 2015 වසර සඳහා අය වැය ලේඛණයක් සකස් කළා.අය වැයට ඡන්දය විමසන අවසාන තප්පරය දක්වා විපක්ෂයේ මන්ත්‍රීවරු කැමැති වෙලා හිටියා.අපි ඔබතුමාලා මහජනතාව එකතු වෙලා හදපු අය වැයට අවසාන මොහොතේ ඔබතුමාලා ඡන්දය දුන්නා.අය වැය ලේඛණය 2015 වැඩ සටහන් සාමාන්‍ය පරිපාලනය කාර්යය මණ්ඩල සේවා ගමන් වියදම් දේශීය විදේශීය වරහන් තුළ මන්ත්‍රීවරුන්ට කියලා ලක්ෂ 03 ක් වෙන් කරලා තියෙනවා.එහෙනම් ඒ වේලාවෙත් මේක වැරදී කියලා කියන්න තිබුණා.ඒ වේලාවේ කිසිම මන්ත්‍රී කෙනෙක් වැරද්දක් නම් කීවේ නෑ.අපේ කාර්යය සාධන ඇගයීම් කටයුතු කරන කොට අඩුම වශයෙන් මෙම මුදලින් 50% ක් වියදම් කරලා තියෙන්න ඕන එම ලකුණු ලබා ගැනීමට.ගාල්ල දිස්ත්‍රික්කයේ බැලුවහම අපි විතරයි මේ වගේ අධ්‍යාපන චාරිකාවක් සඳහා සහභාගී වෙලා නැත්තේ.මේ සම්බන්ධ අදහස් දැක්වීමේදී ජයන්ත මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් බැහැර වෙලා විශාල අදහස් ප්‍රමාණයක් දැක්වුවා.නගර සභාවේ ආදායම් තත්වය හොඳ නෑ කියන අදහසක් තමයි එතුමා කීවේ.1997 දී ශ්‍රී.ල.නි.පක්ෂ පාලනයක් යටතේ නගර සභාවේ පාලනය අපි භාරගත්තේ.අපි භාරගනිද්දි තිබුණ දුක්ඛිත තත්වයට වඩා ප්‍රසස්ත මට්ටමකට අපි අද වන විට මෙය ගෙනවිල්ලා තියෙනවා.සරත් මන්ත්‍රීතුමා කීවා වගේ එ.ජා.පක්ෂ පාලන කාලයේදී රජයෙන් සත පහක වත් ප්‍රතිපාදනයක් නොලැබෙද්දි දැන් සුවිශාල මුදල් ප්‍රමාණයක් සංවර්ධන කටයුතු සඳහා රජයෙන් අපට ලැබෙනවා.ඒ ගැන අපි සතුටු වෙන්න ඕන.අද සමහර වේලාවට තාර දාන්නේ මොන පාරද කියලා අපට හිතා ගන්න බෑ.ඔක්කොම පාරවල් තාර දාලා තියෙන්නේ.කොන්ක්‍රීට් කරලා ඉන්ටලොක්ස් අල්ලලා තියෙන්නේ.දැන් අපි කරන්නේ කානු බඳින එක.පටබැඳිමුල්ලේ සුසානභූමිය අලංකාර කරන එක දැන් අපි කරන්නේ.අති ගරු ජනාධිපතිතුමා අපිව ශක්තිමත් කරලා තියෙන්නේ.ඇත්තටම අපිව නෙවෙයි ජනතාවයි ශක්තිමත් වෙන්නේ මේකෙන්.ජයන්ත මන්ත්‍රීතුමා හීන් ඇල පාර ගැන කතා කරනවා.දැන් මමත් මේ සභාවට ඇවිත් අවුරුදු 18 ක් වෙනවා.ඔබතුමාලා කිසිම කෙනෙක් මේ නගර සභාවට රුපියලක්වත් ගේන්න උත්සහ කරලත් නෑ.ගෙනල්ලත් නෑ.පාර්ලිමේන්තු සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලක්ෂ 1000 කට වැඩි ප්‍රතිපාදන ලැබෙනවා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට නොහැකි වෙලා තියෙනවා කිසිම මුදලක් මේ සභාවට අරගෙන එන්න.ජයන්ත මන්ත්‍රීතුමා අවුරුදු 30 -35 ක් මේ සභාවේ හිටියය කියනවා,එක රුපියලක් ලබා ගන්න සමත් වෙලා නෑ.ඒ ගැන ඔබතුමා කණගාටු වෙන්න ඕන.මොකද ඔබට හිතවත් පාර්ලිමේනතු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙක් නෑ.අපි එදා විපක්ෂයේ මන්ත්‍රීවරු 3 ක් හිටියා.අපි වැඩ කලා.හීන් ඇළ හරස් පාරට ලක්ෂ 10 රජයෙන් දුන්නේ.අපි ලක්ෂ 16 දීලා ලක්ෂ 26 න් තමයි පාර කරලා ඉවර කළේ.ගයන්ත කරුනාතිලක මන්ත්‍රීතුමා එක පාරක් 50,000 ක් දුන්නා විද්‍යාල මාවතට.ඒකේ කාණු හදන්නත් දෙලක්ෂ ගාණක් වියදම් කරලා අපි ඒ කාණු හැදුවා.අපේ පාලන කාලයේ අම්බලන්ගොඩ නගර සභාව මූල්‍යමය අතින් ශක්තිමත් කරන්න විශාල වැඩ කොටසක් කරලා තියෙනවා.සමස්ථ ආදායම තිබ්බේ ලක්ෂ 20 ක් ,බදු කුලී ආදායම තිබ්බේ ලක්ෂ 13 ½ ,අද බදු කුලී ආදායම රුපියල් කෝටියයි.මට මුල් වතාවටම බලපිටිය උසාවියට යන්න වුනා මේ නගර සභාව තමුන්නාන්සේලාගේ පාලන කාලයේ රු.45000 ක් ඊ.ටී.එෆ්. ගෙවන්නැතිව.එහෙම නගර සභාවක් භාර අරගෙන තමයි අද මේ තත්වයට ගෙනත් තියෙන්නේ.අපි සියලුම දෙනාට අන්තර්ජාල පහසුකම් ලබා දුන්නා.අද සභා වාර්තාව ඊ. මේල් කරනවා කීවම ඒකට විරුද්ධ වුණ එකම මන්ත්‍රීවරයත් ජයන්ත මන්ත්‍රීතුමා.එනිසා නවීන තාක්ෂණය හුරු කරන්න මේ වගේ චාරිකා සඳහා සහභාගීවෙන්න ඕන.හැමදේටම විරුද්ධ වෙන්න හොඳ නෑ.එනිසා මේ වගේ අධ්‍යයන චාරිකා අවශ්‍යයි.එනිසා මේ සඳහා කැමති අය ඉන්නවනම් ඡන්දය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

මම ඉල්ලීමක් කරනවා මේ වගේ ලැබුනු ලිපියක් සම්බන්ධයෙන් ඡන්දය විමසීමක් කරන්න එපැයි කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මෙය මුදල් සම්බන්ධ දෙයක් නිසා ඡන්දය විමසීමක් කරන්න වෙනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය අපේ අය වැය ලේඛණයට අනුකූලයි.එනිසයි මේ ලිපිය ඉදිරිපත් කලේ සභාවට.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**

නගර සභාවේ මූල්‍ය තත්වය දැනට අයහපත් නිසා මේ චාරිකාව නගර සභාවේ මුදලින් යාම සම්බන්ධ

යෙන් අපි විරුද්ධයි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයන් පළ වූ බැවින් ඡන්දය විමසීමක් සිදු කරන ලද අතර මේ සම්බන්ධයෙන් පක්ෂව ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා,ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය,ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා,ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා,ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.හාෂිණි මෙනුකා විජේසූරිය මහත්මිය පක්ෂව ඡන්දය ලබා දුන් අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා විෂක්ෂව ඡන්දය ලබා දෙන ලදී.ඒ අනුව වැඩි ඡන්ද 03 ක් මෙම ලිපිය සභා සම්මත විය.**

✠ **සභාවේ දැඩි ගෝෂාකාරී තත්වයක් ඇති විය.**

- **පෙ.ව.11.05 ට පමණ ගරු නගර උප සභාපති කමල් වැල්ලගේ මහතා සභාවට පැමිණෙන ලදී.**

**3:3** ‘ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු තීරණ දැනුම් දීම- අම්බලන්ගොඩ දුම්රිය වේදිකාවේ උතුරු කොණ යා වන පරිදි ගුවන් පාලමක් ඉදි කිරිම’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ දුම්රිය ස්ථානයෙන් අම්බලන්ගොඩ බස් නැවතුම්පලට පිවිසෙන දොරටුව අසලින් දුම්රිය මාර්ගය හරහා අනාරක්ෂිත ලෙස ජනතාව ගමන් කිරීම නිසා අනතුරු විශාල ප්‍රමාණයක් සිදු වී ඇති බවත් විශාල ප්‍රමාණයක් අබාධිත වී ඇති බවත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා වූ බවත් විශේෂයෙන් බස් නැවතුම්පලේ සිට ගා / ප්‍රජාපති ගෝතමී විද්‍යාලය වෙත සහ උපකාරක පන්ති විශාල ප්‍රමාණයකට විකල්ප කෙටි මාර්ගය මෙය වන බැවින් බොහෝ පිරිසක් මෙම අනාරක්ෂිත මාර්ගය භාවිතා කිරීමට හුරු වී ඇති බවත් පවතින මෙම තත්වය අනුව ආරක්ෂිතව මහජනතාව මෙම මාර්ගය හරහා ගමන් කිරීම සඳහා දුම්රිය වේදිකාවේ උතුරු කොන අසල දුම්රිය මාර්ගය හරහා ගුවන් පාලමක් ඉදිකිරීම සුදුසු බව තීරණය වූ බවත් ඒ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුව ඒකමතිකව එකඟතාවය පල කළ බවත් එම ඉදිකිරීම සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට යම් සහයෝගයක් අවශ්‍ය නම් දකුණු පළාත් සභාව හරහා එය ලබා දීමට හැකි බවත තවදුරටත් සඳහන් කළ බවද දන්වා තිබු අතර මේ පිළිබඳව කාරුණිකව අවදානය යොමු කරන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**මෙම ලිපිය ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.**

**3:4** ‘ බස්නැවතුම්පලින් රේල් පාරට වැටෙන වැට සම්බන්ධයි ’ අම්බලන්ගොඩ, විලේගොඩ ප්‍රදේශවාසීන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

බස් නැවතුම්පලේ සිට කඩවීදියට ගොස් එන විලේගොඩ ,දේගොඩ,හීගල් දූව ,පෝරඹ, හල්වතුර ජනතාව හා බස් නැවතුම්පලට යන අයද ප්‍රජපතී ගෝතමී බාලිකා විද්‍යාලයට පැමිණෙන සිසුන්ගේද පහසුව සඳහා බස් නැවතුම්පලේ ආරක්ෂිත වැට ඉවත් කර ඉඩ සලසා දී තිබූ බවත් නමුත් අද එය නැවත වසා දමා ඇති බවත් හැටන් නැෂනල් බැංකුව ළඟින් එන පරෙන් පැමිණීය හොත් වැටෙන්නේ දුම්රිය මාර්ගයට බැවින් මඟී පාලම ඉදිවන තෙක් මෙම ස්ථානයේ තබා තිබූ ඉඩ කඩ නැවත විවෘත කර දෙන මෙන් පුද්ගලයින් 169 දෙනෙකු අත්සන් කරන ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි, ඔය කතාව ඇත්ත.දැන් හැටන් නැෂනල් බැංකුව ළඟින් ඇවිත් එන කොට තවත් අනතුරුදායකයි.පාලමේ වැඩ කටයුතු සිද්ධ වෙයි.මහ ඇමතිතුමත් ඒක කිව්වා.එනිසා මේ වැට විවෘත කරලා දෙන්න.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ වැට වසා දැම්මේ ඇත්තටම ඔතනින් ගමන් කරලා මඟීන් කීප දෙනෙක්ම අනතුරට පත් වුනා.මාධ්‍ය මඟින් එලි කළා මෙතන අනතුරුදායක කපොල්ලක් අම්බලන්ගොඩ නගර සභාවෙන් ඇති කරලා තියෙනවා කියලා.මේක අපි ඇති කරපු එකක් නෙවෙයි.ජනතාව විසින්ම කෙටි පාරවල් විදියට හදා ගනිපු එකක්.අම්බලන්ගොඩ පොලිස් ආරක්ෂක කමිටුවෙන් ඉදිරිපත් වෙච්ච කරනු අනුව මෙය වසා දාන්න කියලා ඉල්ලීමක් කළා.එය සභාවට ඉදිරිපත් කරලා සභාවෙන් ගත්ත තීරණයකට තමයි මේ වැට ගහලා මේක වසලා දැම්මේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාවේ එහෙම තීරණයක් අරගෙන නෑ.මං වාර්තාව බැලුවනේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට පුලුවන්ද සහතිකයක් දෙන්න මෙතන අනතුරක් වෙන් නෑ කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

කොහොමත් දැනුත් මෙතන හැටන් නැෂනල් බැංකුව ළඟින් කට්ටිය එනවා.සමහර වෙලාවට රේල් පාර දීගේ ඇවිත් තමයි යන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙතන දුම්රිය වේදිකාව අවසන් වන තැනින් තමයි මේ මිනිස්සු මාරු වෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

නමුත් ඊට වඩා අනතුරුදායකයි අරහෙන් එනකොට.මොකද රේල් පාර දිගේ එන්න ඕන ධම්මානන්ද පාරට වැටෙන්න.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් මත දෙකම තියෙනවා.මේක වැසුවට ප්‍රසංසා කරන අයත් ඉන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , අපි ඉල්ලීමක් කළා ළමයි 300-400 ක් එනවා ,දුම්රිය එන වේලාවටම තමයි ක්ලාසස් ඇරෙන්නෙත්.කරිත්ත කන්ද පන්සල ළඟ තියෙන පිවිසුම දුම්රිය දෙපාර්තමේන්තුවට කියලා හරි වහන්න කියලා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ලේකම්තුමා,සංසරාජ පාරේ මේ ඉල්ලීම සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට දන්වන්න.

<u>තීරණය</u>

☞ **මෙම අවස්ථාව වන විටද යම් කිසි පිරිසක් විසින් මෙම ආරක්ෂිත දැල ඉවත් කර ඇති බව තාක්ෂණ සේවා නිළධාරී විසින් වාර්තා කර තිබු බැවින් එම ස්ථානය එපරිද්දෙන්ම තැබීමට ගරු සභාව තීරණය කරන ලදී.**

3:5 ‘ පොල්වත්ත ක්‍රීඩා පිටිය වෙන් කිරීම’ මැයෙන් විෂය ලිපිකරු විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

2014.04.01 දින මාසික සභාවේ තීරණය පරිදි ,2015 වර්ෂයට පහත සඳහන් දින නගර සභා ක්‍රිකට් ඇකඩමියේ පුහුණුවීම් සඳහා 2015 ජනවාරි මස 01,03,06,08,10,13,15,17,20,22,24,27,29,31 පෙබරවාරි මස 03,05,07,10,12,14,17,19,21,4,26,28 මාර්තු මස 03,05,07,10,12,14,17,19,21,24,26,28,31 අප්‍රේල් මස 02,04,07,09,11,14,16,18,21,23,25,28,30 මැයි මස 02,05,07,09,12,14,16,19,21,23,26,28,30 ජුනි මස 02,04,06,09,11,13,16,18,20,23,25,27,30 ජූලි මස 02,04,07,09,11,14,16,18,21,23,25,28,30අගෝස්තු මස 01,04,06,08,11,13,15,18,20,22,25,27,29 සැප්තැම්බර් මස 01,03,05,08,10,12,15,17,19,22,24,26,29 ඔක්තෝම්බර් මස 01,03,06,08,10,13,15,17,20,22,24,27,29,31නොවැම්බර් මස 03,05,07,10,12,14,17,19,21,24,26,29,31 දෙසැම්බර් මස 01,03,05,08,10,12,15,17,19,22,24,26,29,31 යන වෙන් කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොවූ බැවින් නගර සභා ක්‍රිකට් ඇකඩමියේ පුහුණුවීම් සඳහා ඉහතින් සඳහන් කළ දිනයන් 2015 වර්ෂය සඳහා ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:6** **‘** සෞඛ්‍ය අංශයේ කසල බැහැරලීම කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතිය යටතේ සේවකයන් බඳවා ගැනීම- 2015 **’** මැයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

සෞඛ්‍ය අංශයේ පිරිසිදු කටයුතු කිරීම සඳහා දැනට සිටින සේථිර සේවකයන් ප්‍රමාණවත් නොවන නිසාවෙන් විශේෂ ව්‍යාපෘතිය යටතේ 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා කසල බැහැරලීම සඳහා සේවකයින් 10 ක්ද කාණු පිරිසිදු කිරීම සඳහා සේවකයින් 05 ක්ද රියදුරන් 05 ක්ද බඳවා ගැනීම සඳහා අනුමැතියද සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කිරීමටද අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සෞඛ්‍ය අංශයේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුකූලව ව්‍යාපෘතිය යටතේ** 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා කසල බැහැරලීම සඳහා සේවකයින් 10 ක්ද කාණු පිරිසිදු කිරීම සඳහා සේවකයින් 05 ක්ද රියදුරන් 05 ක්ද බඳවා **ගැනීමටද සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කිරීමටද ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:7** ‘ වරිපනම් බදු නිදහස් කර ගැනීම ’ මැයෙන් 118-ඒ, කැටන්තොට ,අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ඇම්.එච්.රත්නසීලි මහත්මිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත ලිපිනයේ පදිංචි එම්.එච්.රත්නසීලි වන මාගේ ස්වාමි පුරුෂයා මීට වසර 04 ට පෙර මිය ගිය අතර මාහට කිසිම ආදායම් මාර්ගයක් නොමැති බවත් මීට පෙර වසර 03 ක කාලය වරිපනම් බද්දෙන් නිදහස් කර තිබූ බවත් මෙම වසරද වරිපනම් බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ආර්.අයි මහත්මයා සඳහන් කරලා තියෙනවා, එම්.එච්. රත්නසීලි මහත්මිය කැටන්තොට ප්‍රදේශයේ පදිංචි බවත්,ඇගේ ස්වාමි පුරුෂයා මිය ගොස් ඇති බැවින් දැනට ඇයට කිසිදු ආදායම් මාර්ගයක් නොමැති බවත් ජීවත් වන දේපල වරිපනම් බද්දෙන් නිදහස් කර දෙන ලෙස ඉල්ලීමක් කර තියෙනවා කියලා.මෙම තැනැත්තිය දිළිඳු බවෙන් පෙළෙන බව අංක 83, මහ අම්බලන්ගොඩ ග්‍රාම සේවා වසමේ ග්‍රාම සේවක විසින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සහතික කර ඇති බව සඳහන් කරලා තියෙනවා.ඒ අනුව පසු ගිය වසර වල මේ තැනැත්තියගේ දේපල වරිපනම් බදු වලින් නිදහස් කරලා තියෙන නිසා මේ වසරේත් මෙය සිදු කිරීම සුදුසුයි කියලා යෝජනා කරලා අනුමැතිය සඳහා ඉදිරිපත් කරලා තියෙනවා.සී.සී.ආර් සහ ලේකම් නිර්දේශ කරලා තියෙනවා.පසු ගිය වසර 3 ම මේක නිදහස් කරලා තියෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

පසු ගිය වසර වලත් ඒ මහත්මිය වරිපනම් බදු වලින් නිදහස් කළා.මොකද සභාපතිතුමණි, ඒ මහත්මියගේ සැමියා මේ නගර සභාවේම වැඩ කළ මහත්මයෙක්.

<u>තීරණය</u>

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් 118-ඒ, කැටන්තොට ,අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ඇම්.එච්.රත්නසීලි මහත්මියට නගර සභාවට වරිපනම් ගෙවීම සම්බන්ධයෙන් පසු ගිය වසරේදී ලබා දෙන ලද සහනයම ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

## (04) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

නැත

## (05) යථා පරිදි කල් දී ඇති යෝජනා

**5:1** **ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා (නිළධාරීන් විසින් සකස්කරන ලද පරිපාලන යෝජනා) :-**

**5:1:1** මාදම්පා ගඟ ආශ්‍රිත භූමි ප්‍රදේශය අම්බලන්ගොඩ නගර සභාවට පවරා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණි යෝජනාව සභාගත කරන ලදී.

මාදම්පා ගඟ ආශ්‍රිත පිහිනුම් තටාකය සහ එම භූමි ප්‍රමාණයන් අම්බලන්ගොඩ නගර සභාවට පවරා ගැනීම සුදුසු බව ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇත්තටම මේ යෝජනාව ඉදිරිපත් කරන්න හේතුව දැනට අම්බලන්ගොඩ මාදම්පා ගඟ ආශ්‍රිතව තියෙන පිහිනුම් තටාකය සහ එම භූමිය නගර සභාවට පැවරුම් නියෝගයකින් පැවරීලා නෑ.එනිසා රජයේ ඉඩමක් පවරා ගන්න තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ.

**<u>තීරණය</u>**

ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මාදම්පා ගඟ ආශ්‍රිත පිහිනුම් තටාකය සහ එම භූමි ප්‍රමාණයන් අම්බලන්ගොඩ නගර සභාවට පවරා ගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5:2 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා :- නැත**

**(6) කාරක සභා වාර්තා සලකා බැලීම**

**6: 1** **2014.12.19** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>**
**<u>2014.12.19 ප.ව.2.30</u>**

**<u>සහභාගීත්වය</u>**

| | |
|---|---|
| **1.** පී.එස්.එස්.ද සිල්වා. | මහජන සෞඛ්‍ය |
| **2.** එච්.නයනා චාන්දනී | සංවර්ධන සම්බන්ධීකරණ |
| **3.** වෛද්‍ය එම්.පී.කී.ඩබ්.යූ.කුමාරි | නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව අම්බලන්ගොඩ |
| **4.** පී.සී.සංජීවනි | තාක්ෂණ සේවා නිලධාරි |
| **5.** බී.ඩී.ඊ.කොඩිතුවක්කු | පවුල් සෞඛ්‍ය සේවිකා |
| **6.** ඩී.එස්.ඊ.ගමගේ | පවුල් සෞඛ්‍ය සේවිකා |
| **7.** පී.එච්.එල්.පුෂ්පරාණි | සංවර්ධන සහකාර |
| **8.** ආර්.සුසිලා නන්දනී ද සිල්වා | කළමණාකරණ සහකාර |

මෙදින කමිටුව සඳහා සහභාගීත්වය ප්‍රමාණවත් නොවූ බැවින් කමිටුව පැවැත්වීමට නොහැකි විය.

සකස් කළේ -
පී.එච්.එල්.සී.පුෂ්පරාණි

සංවර්ධන සහකාර (පරිසර) ලේකම්
භාරත සමරසේකර

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගණ පූර්ණය නොමැති නිසා එදින කමිටුව පවත්තලා නෑ.

**ඒ අනුව 2014. 12.19 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2014.12.22** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ක්‍රීඩා කමිටු වාර්තාව - අම්බලන්ගොඩ නගර සභාව**

**දිනය - 2014.12.22**
**වේලාව - පෙ.ව.11.30**
**ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව**
**සහභාගිත්වය -**

| | | |
|---|---|---|
| භාරත සමරසේකර මහතා | - | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| එස්.කේ.පත්මසිරි මහතා | - | ක්‍රීඩා කමිටු සාමාජික. |
| මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා | - | ක්‍රීඩා කමිටු සාමාජික. |
| කසුන් ගාල්ලගේ මහතා | - | ක්‍රීඩා නිලධාරි,අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය |
| ජී. අශෝක කුමාර මහතා | - | ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩී.වී.තරංගි මිය | - | ප්‍රජාසංවර්ධන නිලධාරි, අම්බලන්ගොඩ නගරසභාව. |

**පිළිගැනීම- ලේකම්, භාරත සමරසේකර මහතා**

පවුලේ අවමංගල කටයුත්තක් හේතු කොට ගෙන ගරු සභාපතිතුමා අද දින ක්‍රීඩා කමිටුව සඳහා සහභාගි නොවන බවත් එතුමාගේ උපදෙස් පරිදි කමිටුවේ කටයුතු පවත්වා ගෙන යන බවත් දන්වා සිටිමින් පැමිණි සියළුම මහත්ම මහත්මීන් පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

2014 වර්ෂයේ නගර ක්‍රීඩා තරගාවලියේ ජයගාහක ක්‍රීඩක ක්‍රීඩිකාවන් අගයමින් පවත්වනු ලැබූ කුසලාන සහ සහතිකපත් ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබාදුන් ක්‍රීඩාකමිටුවේ සියළුම මහත්වරුන්ට නගර සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය වෙනුවෙන් සිය කෘතඥතාව පළකර සිටින ලදි.

**වෙනත් කරුණු-**

**එස්.කේ.පත්මසිරි මහතා-**

I.O.C පොත තමන්සතුව තිබෙන බවත් එය ඡායා පිටපත් කරගැනීම සඳහා ලබා දීමට හැකි බව දන්වා සිටින ලදි.

**කසුන් ගාල්ලගේ මහතා -**

ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු හේතු කොට ගෙන ඉදිරියේ දී පාසල් තරග පොල්වත්ත ක්‍රීඩාංගණයේ දී පැවැත්වීමට නියමිත බැවින් මළල ක්‍රීඩා තරග පැවැත්වීමට හැකි ලෙස එම ක්‍රීඩාංගණයේ අදාළ සකස් කිරීම් කඩිනමන් සිදුකර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

මළල ක්‍රීඩා තරග පැවැත්වීමට හැකි ලෙස පොල්වත්ත ක්‍රීඩාංගණය සකස් කිරිමෙන් ඉදිරියේ දී මළල

ක්‍රීඩා මූලික තරග එහි පවත්වා අවසන් තරග සහ ක්‍රීඩා උත්සව පමණක් මහජන ක්‍රීඩාංගණයේ පැවැත්වීමට හැකි බවත් පෙන්වා දෙන ලදි.

**ඩී.වී.තරංගි-**
තාක්ෂණ නිලධාරි, ක්‍රීඩාභූමි උපදේශක, ක්‍රීඩාභූමි භාරකරු, දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණුකරු සහ ක්‍රීඩා නිලධාරි සමග ක්‍රීඩාංගණය පරික්ෂා කර සිදු කළයුතු ඉදිකිරීම් සහ සකස් කිරීමවලට අදාළ ඇස්තමේන්තුව සකස් කර සභාවට ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇති බව පැහැදිලි කරන ලදි.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**
ක්‍රීඩාමණ්ඩපයේ සිදුකළ යුතු ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර දෙන ලෙසට මීට පෙර ද ඉල්ලීම් කරනු ලැබුවද එය සිදු නොවූ බව. කාමර තුනේ දොරවල් තුන හෝ සාදා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.
**ස්තුති කථාව - ප්‍රජාසංවර්ධන නිලධාරි,ඩී.වී.තරංගි මිය.**
අද දින තම වටිනා කාලය හා ශ්‍රමය කැප කරමින් කමිටුව සඳහා පැමිණි සියළුම මහත්ම මහත්මීන්ට ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් තම අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම වෙනුවෙන් ස්තුතිය පළකරමින් කමිටුවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ-
ඩී.වී.තරංගි,
ප්‍රජා සංවර්ධන නිලධාරි.

ලේකම්,

අම්බලන්ගොඩ නගර සභාව.

**ඒ අනුව 2014.12.22 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2014.12.22** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ස්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාව</u>**

**<u>සංවර්ධන උපදේශක සහා රැස්වීම් වාර්තාව</u>**

දිනය - 2014.12.22 වේලාව - ප.ව.2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

පැමිණීම

1. භාරත සමරසේක රමහතා - ලේකම්, නගර සභාව අම්බලන්ගොඩ.
2. ජී.ඩබ්.ගුණසිරි මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
3. එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව අම්බලන්ගොඩ.
4. එම්.මලිත් ප්රනාන්දු මහතා - තාක්ෂණ නිලධාරි, නගර සභාව අම්බලන්ගොඩ.
5. බර්ටි රණසූරිය මහතා - පෝරඹ, උපදේශක කමිටු සාමාජික ප්රජා නියෝජිත.
6. එච්.මහින්දසේන මහතා - ඕකන්ද, උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත.
7. පී.එස්.එස්.ද. සිල්වා මහතා - මහජන සෞඛ්‍ය පරික්ෂක, නගර සභාව අම්බලන්ගොඩ.
| මාර්තු | 7 | 5 | 4 | 4 | 5 | 5 | 3 |
| අප්‍රේල් | 3 | 5 | 6 | 2 | 1 | 3 | 5 |
| මැයි | 4 | 2 | 5 | 4 | 3 | 5 | 8 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ජුනි | 2 | 4 | 3 | 3 | 1 | 2 | 6 |
| ජූලි | 4 | 3 | 4 | 2 | 2 | 4 | 3 |
| අගෝ: | 4 | 2 | 2 | 7 | 1 | 4 | 5 |
| සැප්තැ: | 7 | 2 | 3 | 5 | 4 | 4 | 6 |

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලද අතර අවශ්‍ය මන්ත්‍රීවරුන්ට වාර්තාවේ පිටපතක් ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:2** '**ප්‍රාදේශීය සාහිත්‍ය උළෙලට සමගාමීව පැවැත්වෙන කෝළම් සහ ශාන්තිකර්ම සංදර්ශනය සඳහා කැනපි ලබා ගැනීම '** මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.12.19 වන දින පැවැත්වෙන ප්‍රාදේශීය සාහිත්‍ය උළෙලට සමගාමීව පැවැත්වෙන කෝළම් සහ ශාන්තිකර්ම සංදර්ශනය සඳහා කැනපි 10 ක් අවශ්‍යව ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සහා ආවරණ අනුමැතියට යටත්ව අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට , ප්‍රාදේශීය සාහිත්‍ය උළෙල සඳහා කැනපි ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:3** 'ප්‍රාදේශීය සාහිත්‍ය උළෙලට සමගාමීව පැවැත්වෙන කෝළම් සහ ශාන්තිකර්ම සංදර්ශනය සඳහා කොඩි කණු සහ පුටු ලබා ගැනීම **'** මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.12.19 වන දින පැවැත්වෙන ප්‍රාදේශීය සාහිත්‍ය උළෙලට සමගාමීව පැවැත්වෙන කෝළම් සහ ශාන්තිකර්ම සංදර්ශනය සඳහා පාට කොඩි 50 ක් ,කොඩි කණු 50ක් සහ පුටු 300 ක් අවශ්‍යව ඇති බවත් මෙම කොඩි, කොඩි කණු සහ පුටු නොමිලයේ ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සහා ආවරණ අනුමැතියට යටත්ව අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට , ප්‍රාදේශීය සාහිත්‍ය උළෙල සඳහා පාට කොඩි, කොඩි කණු සහ පුටු ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:4** **'** පුටු 50 ක් ලබා ගැනීම **'** මැයෙන් අම්බලන්ගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ මව් කමිටු රැස්වීම 2014.12.18 වන දින පැවැත්වීමට නියමිත බැවින් අයකිරීමකින් තොරව පුටු 50 ක් 2014.12.18 වන දින පැය 10 00 ට ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සහා ආවරණ අනුමැතියට යටත්ව අම්බලන්ගොඩ පොලස් ස්ථානයට පුටු 50 ක් ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:5** ‘ සම්මා අභිමානී ආගමික වැඩ සටහන පැවැත්වීම වෙනුවෙන් ස්තුතිය පුදකිරීම ’ මැයෙන් බූස්ස යුධ හමුදා කඳවුරේ 141 බල සේනාවේ බළසේනාධිපති විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.11.30 වන දින 18 00 පැයට අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේදී 141 බලසේනා මූලස්ථානයේ සංවිධානයෙන් සහ පූජ්‍ය උඩුවේ ධම්මාලෝක ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් විෂයගත ආගමික වැඩ සටහන පොදු ජනතාව වෙනුවෙන් සාර්ථකව පැවැත්වූ බවත් ඒ වෙනුවෙන් දක්වන ලද සහයෝගය වෙනුවෙන් නගරාධිපතිතුමා සහ කාර්යය මණ්ඩලය සඳහා කෘතඥ පූර්වක ස්තුතිය පිරිනමන බව සඳහන් කර තිබුණි.

<u>තීරණය</u>

**ගරු සභාවේ සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**11:6** ‘ ස්තුතිය පුද කිරීම ’ මැයෙන් අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

දැයට කිරුළ ජාතික වැඩ සටහන වෙනුවෙන් ලබා දෙන ලද ගොඩනැඟිලි සංකීර්ණයට මුල්ගල තැබීමේ උත්සවය සඳහා කොඩි කණු සහ කොඩි නොමිලයේ ලබා දීම වෙනුවෙන් සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පලකර තිබුණි.

<u>තීරණය</u>

**ගරු සභාවේ සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**11:7** ‘ප්‍රාදේශීය සාහිත්‍ය උළෙලට සමගාමීව පැවැත්වෙන කෝළම් සහ ශාන්තිකර්ම සංදර්ශනය පිළිබඳ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය සඳහා අවසර ලබා ගැනීම ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.12.19 වන දින උදෑසන 9.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 පමණ වන තෙක් ප්‍රාදේශීය සාහිත්‍ය උළෙලට සමගාමීව පවත්වන කෝළම් මඩු සහ ශාන්ති කර්ම සංදර්ශනය පිළිබඳ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීමට සැලසුම්කර ඇති බවත් ප්‍රධාන ප්‍රචාරක පුවරු 2 බස්නැවතුම්පළ ඉදිරිපිට සහ රොසෙත් රෝහල අසලද සෙසු දැන්වීම් පුවරු මාර්ගය දෙපසද සවි කිරීමට බලාපොරොත්තු වන බව සඳහන් කර තිබූ අතර ඒ සඳහා අවසරය ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සහා ආවරණ අනුමැතියට යටත්ව අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට , ප්‍රාදේශීය සාහිත්‍ය උළෙල සඳහා ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:8** ‘නගර ශාලාව ලබා ගැනීම ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.12.19 වන දින උදෑසන 9.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 පමණ වන තෙක් ප්‍රාදේශීය සාහිත්‍ය උළෙලට සමගාමීව පවත්වන කෝළම් මඩු සහ ශාන්ති කර්ම සංදර්ශනය සඳහා නගර සභා ශාලාව සහ කැනපි 10 ක් ගාස්තු අය කිරීමකින් තොරව ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සහා ආවරණ අනුමැතියට යටත්ව අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට , ප්‍රාදේශීය සාහිත්‍ය උළෙල සඳහා නගර ශාලාව ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

☞ **පෙ.ව.11.28 ට පමණ ගරු නගර නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා සහ ඒ.ඩබ්.ජගත් කුමාර මහතා ගරු සභාවෙන් මදකට ඉවත්ව යන ලදී.**

**11:9** ‘2014දෙසැම්බර් මස අවසානයට පෙර කඩිනමින් අවසන් කළ යුතු පෝරඹ හල්වතුර හන්දිය පුලුල් කිරීමේ කටයුතු සඳහා නගර සභා ගල් රෝල ලබා ගැනීම සඳහා ’ මැයෙන් අංක 83,කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහතින් සඳහන් කරන ලද කොන්ත්‍රාත්තුව දෙසැම්බර් මස අවසන් වීමට පෙර ඉටු කර දීමට අවශ්‍ය බවත් පොළව තලා ගැනීමට ගල් රෝලක් ලබා ගැනීමට අපහසු වී ඇති බැවින් නගර සභාව සතු ගල් රෝල මුදල් ගෙවා ලබා ගැනීමට අවසර ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් නගර සභාවේ ඉල්ලීමක් මත සිදු කරන ඉහත සඳහන් කළ කර්මාන්තය සඳහා සහා ආවරණ අනුමැතියට යටත්ව අංක 83,කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලයට ගාස්තු අය කර ගල් රෝල ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

☞ **පෙ.ව.11.32 ට පමණ ගරු නගර නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.භාෂිණී මෙනුකා විජේසූරිය මහත්මිය ගරු ඉවත්ව යන ලදී.**

**(12)** **න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු**

**12:01** “ නගර සභා මාර්ග තලනය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි’’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාව සතු මාර්ග තලනයට නව එංජිමක් සවිකර අළුත්වැඩියා කර ධාවන තත්වයට පත් කිරිම සඳහා දරණ ලද වියදම් සාරාංශ ලේඛනය ඉදිරිපත් කර තිබුණි.

<u>නගර සභා මාර්ග තලනයට නව එංජිමක් සවි කර අලුත්වැඩියා කිරීමේ වියදම් සාරාංශය</u>

| කාර්යය | වියදම(රු.) |
|---|---|
| 01.නව එංජිම ලබා ගැනීම | 625000.00 |
| 02.තහඩු කැපීම සහ නැවීම | 3105.04 |
| 03.ගියර් පෙට්ටියේ ප්ලේට් දෙක | 1800.00 |
| 04.ගෑස් කටර් නොසල් එක | 825.00 |
| 05.කුරුස ජොයින්ට් පෑස්සීම | 1200.00 |
| 06.බෝල්ට් ඇණ සහ වොෂර් | 1115.50 |
| 07.හෝර්ස් සහ හෝර්ස් ක්ලිප් | 1965.00 |
| 08.වැලි කඩදාසි | 100.00 |
| 09.විදුලි පද්ධතියට අවශ්‍ය ද්‍රව්‍ය | 10130.00 |
| 10.එයාර් ක්ලීනර් හෝස් එක | 840.00 |
| 11.තහඩු කැපීමට කැපුම් තල | 460.00 |
| 12.ෆයි වීල් එක ලියවා තව් විදීමට | 3700.00 |
| 13.ගැල්වොනයිස් ඇණ | 1010.00 |
| 14.ඉදිරිපස රෝදයේ ඇක්සල් පොට ලියවීම | 8000.00 |
| 15.ඇක්සලේටරයේ ඇණ තව් විදීම | 100.00 |
| 16.විදුලි පද්ධතියට අවශය බාහිර උපාංග(විදුලි ලාම්පු,ස්විච්,මීටර) | 8475.00 |
| 17.විදුලි පද්ධතිය සැකසීම | 5000.00 |
| 18.බැටරි ටර්මිනල් පෑස්සීම | 900.00 |
| 19.ඉන්ධන පිල්ටරය ලබා ගැනීම | 6800.00 |
| 20.තීන්ත ලබා ගැනීම | 24875.00 |
| 21.උපාංග සේදීමට භූමිතෙල් | 1000.00 |
| 22.සේවක දිරි දීමනා ගෙවීම් | <u>5750.00</u> |
| එකතුව | <u>712150.54</u> |

**තීරණය**

☞ **මෙම වියදම් වාර්තාව ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.**

**12:02** "තණ කොළ කපන මැෂිමක් ලබා ගැනීම" මැයෙන් ආදේශක ආදාහනාගාර ක්‍රියාකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවට අයත් පටබැදිමුල්ල ආදාහනාගාරය තුළ පාවිච්චි කිරීමෙන් පසු ගලවා ඉවත් කරන ලද යකඩ කොටස් ඇති බවත් ඒවා දිරාපත් වෙමින් පවතින බවත් ,එම යකඩ කොටස් වලින් ප්‍රයෝජනයක් ගැනීම සඳමහා ඒවා මුදල් බවට පත් කර එම මුදලින් තණ කොළ කපන මැෂිමක් ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

මේ පිළිබඳව තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය වනුයේද මෙම යකඩ කොටස් මිළ ගණන් කැඳවීමෙන් පසු විකිණීම සහ එම මුදල් වලින් ආදාහනාගාර 02 ක සඳහා තණකොළ කපන මැෂමක් මිළදී ගැනීම සුදුසු බවයි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් තණ කොළ කපන මැෂිමක් ආදාහනාගාරයට ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙ ලදී.**

**12:03** "පුවත් පත් දැන්වීමක් පළ කිරීමට අනුමැතිය ලබා ගැනීම " මැයෙන් සැපයුම් නිළධාරිනිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.12.02 දිනැති මාසික සභාවේ තීරණ අංක 11.01යටතේ නගර සභාවට නව ට්‍රැක්ටර් රථ 02 ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලැබී ඇති බවත් ඒ අනුව මිළදී ගත යුතු ට්‍රැක්ටර් පිළිබඳව පිරිවිතර වාර්තාවක් පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරු මහතා විසින් 2014.12.10 දිනැති ලිපිය මඟින් නගර සභාවට යොමු කර ඇති බවත් ඒ අනුව නව ට්‍රැක්ටර් රථ 02 ක් මිලදී ගැනීම සඳහා පිරිවිතර ඇතුලත් ප්‍රසම්පාදන දැන්වීම පුවත් පතක පළ කිරීමට සභා අනුමැතිය ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් නගර සභාවට නව ට්‍රැක්ටර් රථ 02ක් මිලදී ගැනීම සම්බන්ධ පිරිවිතර පත ඇතුලත් ප්‍රසම්පාදන දැන්වීමක් පුවත් පතක පළ කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:04** "මුද්දර සඳහා රු.10000.00 ක මුදල් අග්‍රිමයක් ලබා ගැනීම " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභා කාර්යාලයේ මුද්දර මැෂිම අක්‍රීය වී ඇති බැවින් එදිනෙදා මුද්දර තැපැල් කිරීම සඳහා පහත පරිදි මුදල් වැය වන බැවින් මුද්දර සඳහා රු.10000.00 ක් මුදලක් ලබා ගැනීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

ආසන්න වශයෙන් දිනකට මුද්දර සඳහා වැය වන මුදල

සාමාන්‍ය තැපැල සඳහා දිනකට 40 x 10 = 400.00

ලියාපදිංචි තැපැල සඳහා 05 x 35 = 175.00

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කාර්යාලයීය දෛනික ලිපි තැපැල් කිරීම සඳහා මසකට රු.10000.00 ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:05**"අම්බලන්ගොඩ නගර සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව " මැයෙන් විගනකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය විගණකාධිපති විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

විගණකාධිපතිගේ SN/GL/F/AMUC/5/13/11 සමාංක සහිත 2014.12.23 දිනැති, අම්බලන්ගොඩ නගර සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව ඉදිරිපත් කර තිබූ අතර මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ,මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 වන දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වන බවද සඳහන් කර තිබුණි.

**ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්දයෙන් ඇත්තටම මම සතුටු වෙනවා.විපක්ෂයේ මතය විගණකාධිපති විසින් බැහැර කරලා තියෙනවා.තමුන්නාන්සේලාගේ කාලේ කිසිම මතයක් ලැබිලා නෑ.දැනට අපට වසර 3 ක් මතයක් ලැබුණා.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා මෙම විගණන වාර්තාව ඉදිරිපත් කරන ලදී.**

- **ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා ගරු සභාවට නැවතත් පැමිණෙන ලදී.**

**12:06** "වරිපනම් මෘදුකාංගයට අයත් මුද්‍රණ යන්ත්‍රය අක්‍රීය වීම සම්බන්ධවයි " මැයෙන් විෂය නිළධාරීනිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත කරුණට අදාලව වරිපනම් මෘදුකාංගයට අදාල මුද්‍රණ යන්ත්‍රයේ කැනොන් රිබන් නොමැති වීම නිසා 2014.12.18 දින ප.ව.1.00 සිට මේ වන තුරුත් (2014.12.22 පෙ.ව.9.30) අක්‍රීයව පවතින බවත් 2015 වර්ෂයට අදාළ තක්සේරු නිවේදන 2014.12.31 වන දිනට ප්‍රථම මුද්‍රණය කර බෙදාහැරිය යුතු වුවත් මෙම අඩුපාඩු නිසාවෙන් එය සිදු කිරීමට නොහැකි වන බව සඳහන් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් වැටුප් විධය භාර නිළධාරිනියද වැටුප් සකස් කිරීමට අවශ්‍ය බැවින් මුද්‍රණ යන්තුයට සුදුසු රිබන් කඩිනමින් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

මේ සම්බන්ධයෙන් සැපයුම් නිළධාරිනිය සඳහන් කර තිබුණේ 2014.11.25 දින මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන 02 හිම මෙම රිබන් නොමැති බවය.ඒ අනුව කඩිනම් අවශ්‍යතාවය මත අත්තිකාරම් මුදලක් ලබා ගෙන රිබන් මිලදී ගැනීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සහා ආවරණ අනුමැතියට යටත්ව අනුමැතිය ලබා දී තිබූ කඩිනම් අවශ්‍යතාවයන් වූ වරිපනම් තක්සේරු පත්‍රිකා මුද්‍රණය හා වැටුප් සකස් කිරීමේ කටයුතු සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගෙන කාබන් රිබන් මිලදී ගැනීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

- **ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා ගරු සභාවට නැවතත් පැමිණෙන ලදී.**

**12:07** "කාර්යාලයේ මේස සඳහා රෙදි ලබාගැනීම " මැයෙන් ප්‍රධාන කළමණාකරන සහකාර විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

කාර්යාලයේ නිළධාරීන්ගේ මේස රෙදි ඉරී දුර්වර්ණ වී ඇති බැවින් අලුතින් මේස රෙදි ලබා දීම සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කාර්යාලයීය මේස සඳහා නව මේස රෙදි මිලදී ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:08** "තණකොළ කපන මැෂිම ලබා ගැනීම සඳහා " මැයෙන් අම්බලන්ගොඩ පොලිස් ස්ථානය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2015.01.05 දින අති ගරු ජනාධිපත්තුමා අම්බලන්ගොඩ නගරයේ රැස්වීමකට සහභාගී වන බැවින් ,එතුමා පැමිණෙන ගුවන් යානය නතර කිරීම සහ එහි ආරක්ෂාව සැලසීම සඳහා අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට අයත් ක්‍රීඩා භූමිය පිරිසිදු කර ගැනීම සඳහා නගර සභා කාර්යාලයට අයත් තණ කොල කපන මැෂිම 2014.12.30 සහ 31 යන දින වලට ගාස්තු අය කිරීමකින් තොරව ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පොලිස් ස්ථානයෙන් තෙල් සපයා ගැනීමේ පදනම මත සහා ආවරණ අනුමැතියට යටත්ව තණ කොළ කපන මැෂිම 2014.12.30 සහ 31 යන දෙදින තුළ අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.**

**12:09** "ජල නල එලීම සඳහා මාර්ගය පළුදු කිරීම සම්බන්ධවයි " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉදිකළ හෙප්පුමුල්ල සේවා පියසට ජලය ලබා ගැනීමට මාර්ගය පළුදු කිරීමේ ගාස්තුව රු.795.20 ක් බවත් ,එය නිදහස් කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් එය නිදහස් කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් හෙප්පුමුල්ල සේවා පියසට ජලය ලබා ගැනීමේදී මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් අය කළ යුතු ගාස්තුව වන රු.795.20 ක ගාස්තුවෙන් එම ආයතනය නිදහස් කිරීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:10** “අම්බලන්ගොඩ නගරයේ රූකඩ සංදර්ශනයක් පැවැත්වීම ” මැයෙන් ප්‍රජා සංවර්ධන නිළධාරිනිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

සාරංගා රූකඩ ආයතනය මගින් ,ජාතික කලාවක් ලෙස රූකඩ කලාව ඉදිරියට ගෙන ඒමට සභාපතිතුමාගේ අනුග්‍රහය යටතේ අම්බලන්ගොඩ පුරහලේදී කලාත්මක රූකඩ නාට්‍ය සංදර්ශනයක් පැවැත්වීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා තිබූ අතර මේ සඳහා 2015 මාර්තු මස දිනයක් යොදා ගත හැකි බවද සඳහන් කර තිබුණි.

ජී.ප්‍රේමින් මහතාගේ ඉල්ලීම පරිදි ජාත්‍යන්තර රූකඩ නාට්‍ය දිනයට සමගාමීව (මාර්තු 21)විනෝදාත්මක රූකඩ සංධර්ශනයක් පැවැත්වීමට නගර සභාවේ අනුග්‍රහය ලබා දීම සුදුසු යැයි යෝජනා කර තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ජී.ප්‍රේමින් මහතාගේ ඉල්ලීම පරිදි ජාත්‍යන්තර රූකඩ නාට්‍ය දිනයට සමගාමීව විනෝදාත්මක රූකඩ සංධර්ශනයක් පැවැත්වීමට නගර සභාවේ සහයෝගය ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:11** “කොඩි කණු 15 ක් ලබා ගැනීම සඳහා’’මැයෙන් අම්බලන්ගොඩ පොලිස් ස්ථානය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2015.01.01 වන දින අම්බලන්ගොඩ පොලිස් ක්‍රීඩා භූමියේ පැවැත්වීමට නියමිත ප්‍රතිඥා දීමේ උත්සවය සඳහා ක්‍රීඩා භූමිය සැරසීමට කොඩි කණු 15 ක් 2014.12.31 ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ සහා ආවරණ අනුමැතියට යටත්ව අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට කොඩි කණු 15 ක් ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** “2014 සාමාන්‍ය පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා ප්‍රතිපාදන වියදම් වීම පිළිබඳ විස්තරය’’මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 නොවැම්බර් මස වැඩ සටහන් 01 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**;SrKh**

☛ මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12:13** “2014 සෞඛ්‍ය සේවා ප්‍රතිපාදන වියදම් වීම පිළිබඳ විස්තරය’’මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 නොවැම්බර් මස වැඩ සටහන් 02 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**;SrKh**

☛ මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12:14** “2014 භෞතික සැලසුම්කිරීම,මංමාවත් සහ ලගාඩනැඟිලි ප්‍රතිපාදන වියදම් වීම පිළිබඳ විස්තරය’’මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 නොවැම්බර් මස වැඩ සටහන් 03 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**;SrKh**

☛ මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12:15** “2014 වෙළඳපල හා අනෙකුත් ප්‍රතිපාදන වියදම් වීම පිළිබඳ විස්තරය’’මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2014 නොවැම්බර් මස වැඩ සටහන් 05 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**;SrKh**

☛ මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12:16** "2014 සුභ සාධක සේවා ප්‍රතිපාදන වියදම් වීම පිළිබඳ විස්තරය''මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 නොවැම්බර් මස වැඩ සටහන් 06 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**<u>;SrKh</u>**

☛ මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12:17** " ආදායම් හිඟ ශේෂ වාර්තා 2013/2014 ''මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

අම්/නස/02/06 විෂයට අදාල නොවැම්බර් සහ දෙසැම්බර් මස අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:18** " ආදායම් හිඟ ශේෂ වාර්තා 2013/2014 ''මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

අම්/නස/02/03 විෂයට අදාල නොවැම්බර් සහ දෙසැම්බර් මස අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:19** " ආදායම් හිඟ ශේෂ වාර්තා 2013/2014 ''මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

අම්/නස/02/05 විෂයට අදාල නොවැම්බර් සහ දෙසැම්බර් මස අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින්ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:20** " ආදායම් හිඟ ශේෂ වාර්තා -වරිපනම් - 2013/2014 ''මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

අම්/නස/02/02 විෂයට අදාල නොවැම්බර් සහ දෙසැම්බර් මස අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින්ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:21** " ආදායම් හිඟ ශේෂ වාර්තා - 2013/2014 ''මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

අම්/නස/02/04 විෂයට අදාල නොවැම්බර් සහ දෙසැම්බර් මස අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින්ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:22** " 2015 වර්ෂය සඳහා ධර්මාශෝක විද්‍යාලයට ළමුන් ඇතුලත් කරගැනීම සම්බන්ධවයි''මැයෙන් මහ අම්බලන්ගොඩ ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ කිසිදු ළමයකුට ආසන්නතාවය අනුව ධර්මාශෝක විද්‍යාලයට ඇතුලත් වීමට නොහැකි වී ඇති බවත් ,එයට හේතුව කුලරත්න විද්‍යාලය ගුවනින් මහ අම්බලන්ගොඩ ප්‍රදේශයට ආසන්න යැයි පවසමින් සම්මුඛ පරීක්ෂණයෙන් ලබා දුන් මුළු ලකුණු වලින් ලකුණු 05 බැගින් කපා හරින ලද බවත් නමුදු කුලරත්න විද්‍යාලයට ඉතා පහසුවෙන් ළඟා විය හැක්කේ වෙල හා ගහ පසු කරමින් බවත් මහා මාර්ගයෙන් ගිය විට කුලරත්න විද්‍යාලයට යා යුත්තේ ධර්මාශෝක විද්‍යාලය පසු කරමින් බවත් ,චක්‍ර ලේඛණ වලට අනුව නිවසට ආසන්න පාසලක් තිබුණද එයට පහසුවෙන් ළඟා විය නොහැකි නම් ලකුණු කැපිය නොහැකි බවත් ගිය වර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් කුලරත්න විද්‍යාලයට ලකුණු කපා නොමැති බවත් සඳහන් කර තිබූ අතර

අම්බලන්ගොඩ නගර සභාවට බදු ගෙවන ,අම්බලන්ගොඩ නගර සභාවට මහජන නියෝජිතයින් පත් කරන අම්බලන්ගොඩ ස්ථිර පදිංචි කරුවන්ට බලවත් අසාධාරණයක් මෙමඟින් සිදු වී ඇති බවත් සඳහන් කරමින් මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ පුද්ගලයින් 48 දෙනෙකු අත්සන් කරමින් මෙම ලිපිය ඉදිරිපත් කර තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මම හිතන්නේ පසු ගිය වසරේ ගංහා ඇළ දොළ හරහා යන්න තියෙන් ඒවට ලකුණු කපලා නෑ.ඇත්තටම මහ අම්බලන්ගොඩ කෙනෙකුට ධර්මාශෝක විද්‍යාලය පසු කරගෙන තමයිකුලරත්නෙට යන්න වෙන්නේ .ඉතින් මම හිතන්නේ අපි සියලු දෙනාම එකතුවෙලා අධ්‍යාපන ලේකම්තුමාට ඉල්ලීමක් කරමු මේ ගංහා ඇළ දොල තියෙන මාර්ග සහ ප්‍රසිද්ධ මාර්ගයෙන් ගියහම යන දුර සලකා බලා මේ ලකුණු කැපීම කරන්න කියලා සහ පසු ගිය වසරේ එහෙම ලකුණු කැපුවේ නැත්නම් මේ වසරේදීත් ඒ සහනයම ජනතාවට ලබා දන්න කියලා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි, හල් වතුරෙත් ළමුන් 2 ක්ට කපලා තියෙනවා කුලරත්නෙට.හල්වතුරේ ගෑණු ළමයෙක්ට නම් ලකුණු 05 ක් කැපෙන්න ඕන.නමුත් ධර්මාශෝකෙට කැපුන්නෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

මෙතෙක් කල් මහ අම්බලන්ගොඩ ළමුන් ධර්මාශෝක විද්‍යාලයට ඇතුලත් කිරීමේදී කුලරත්න විද්‍යාලයට ලකුණු කැපුන්නෑ.මහ අම්බලන්ගොඩ ජනතාවට 4 වතාවක් මාදම්පා ගඟ තරණය කරන්න වෙනවා.ඒ අනුව ධර්මාශෝක විද්‍යාලයට ගුවන් දුර බලද්දි ගුවන් දුර වෙනදට වඩා වෙනස් වෙලාද කියලා අපිට වික්ෂිප්තභාවයක් ඇති වෙලා තියෙනවා.මේ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගර සභාව විදියට නිවරදි තීරණයක් අපි ගනිමු කියමින් මම නිහඬ වෙනවා සභාපතිතුමණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

අධ්‍යාපන ලේකම්ට මේ පිළිබඳ දැන් කියලා වැඩක් නෑ සභාපතිතුමණි.මොකද දැන් මේ දේ වෙලා ඉවරයි.අපි දැන් අධ්‍යාපන ලේකම්ට ලියන ගමන් ,කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකතුමියටත් දාලා සමීක්ෂණයක් කරමු 2014 වර්ෂයේ අම්බලන්ගොඩ නගරයේ පාසල් යන වයසේ සිටින ළමුන් ගැන.එම්.ඕ.එච් එකෙන් ගන්න පුලුවන් අපට.මං හිතන විදියට ළමයි 200 ක් වත් නෑ.එනිසා අපි ඉල්ලමු අම්බලන්ගොඩ ළමුන්ට ධර්මාහෝක විද්‍යාලය අහිමි වීම පිළිබඳ නැවත සමීක්ෂණයක් කරලා අපට දෙන්න කියලා.අම්බලන්ගොඩ ගැන නොදන්න අය මේ සම්මුඛ පරීක්ෂණයට හිටියනම් ළමුන්ට ඇත්තටම අසාධාරණයක් වෙනවනේ.තමුන්නාන්සේට මම එක උදාහරණයක් කියන්නම්.අම්බලන්ගොඩ ධීවර ශාලාව ඉදිරිපිට උපාලි මහත්තයගේ ළමයා යන්නේ මීටියාගොඩ ස්කෝලයකට.අම්බලන්ගොඩ මෙච්චර ස්කෝල තිබිලත් ඒ ළමයට පාසලක් ලැබුණේ නෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

මේ ලිපිය සම්බන්ධයෙන් කතා කරද්දී සෑම වසරකදීම අපි මෙය කතා කරනවා.මේකේ නිසි බලධරයා ලේකම්තුමා නෙවෙයි.එක වසර ළමුන් ඇතුලත් කර ගැනීම සම්බන්ධ චක්‍ර ලේක සංශෝධනය කරන කෙනයි අපි හමුවෙන්න ඕන.අපට බලපාන ආකාරයට මේ චක්‍ර ලේඛ වෙනස් කරන්න බෑ.මුළු ලංකාවටම මේවා අදාලයිනේ.මුළු පාර්ලිමේන්තුවටම මේක ප්‍රශ්නයක්.එක්කෝ අපි යෝජනා කරන්න ඕන මේ සියලු දේම අයින් කරලා කිලෝ මීටරේ දුරට මේක කලින් තිබුණා වගේ හදන්න කියලා.එහෙම නැත්නම් 2009 අපේ ළදරු උපත්

ටික ගන්න පුලුවන් අපට.ඒක නිත්‍යානුකූලයි.2009 ඉපදිලා තියෙන්නේ 200 නම් කොහොමද අයදුම් පත් 400 ක් එන්නේ.මේ ග්‍රාමසේවකවරු සහතික දෙනවා.ග්‍රාමසේවක සහතිකය දුන්නම මොනම අධිකරණයකවත් මේකට අභියෝග කරන්න බෑ.එනිසා මේක ලේකම්ට ලියලා වැඩක් නෑ.එනිසා මම කියන්නේ අපි මන්ත්‍රීවරු විදියට එකතුවේලා මේකට මොකක් හරි කරමු.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා මේ චක්‍ර ලේකයට සුප්‍රීම් කෝට් එකේ අනුමැතිය ලැබිලා තියෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

ඒක හරි සභාපතිතුමා,ඒක වෙනස් කරන්න කියනවා නෙවෙයි.මම කියන්නේ උපත් විස්තර අනුව 2009 ළමයි 200 ඉපදීලා තියෙන්නේ ,ළමයි 750 ක අයදුම් පත් කොහොමද ධර්මාශෝකෙට එන්නේ.600 දේවානන්දෙට එන්නේ කොහොමද.ග්‍රාමසේවකලා කියන විදියට, අනෙක් කැටගරී වලට 1500 ක් අයින් කළත් 1000 ක් ළමයි ඉපදිලා තියෙනවා.අපට මෙතනදී විතරයි අභියෝග කරන්න පුලුවන්.මේ දෙමව්පියෝ 48 දෙනා සූදානම් නම් නඩු යන්න, අපි මේ උදව්ව කරන්න ඕන.එතකොට බොරු කියන ග්‍රාමසේවක වරුන්ගේ වැඩ තහනම් කරලා හරි දාවිනේ.එක පාරක් කළහම ආයේ බොරු සහතික දෙන එකක් නෑ.චක්‍ර ලේඛයෙත් අපට සංශෝධනයක් ඉල්ලන්න පුලුවන් ගංහා ඇළ දොළ වලට කපන්න කියලා පාරකින් ලඟා විය නොහැකි නම්.ඇමතිකෙනකුටවත් මෙය කරන්න බෑ.මොකද ඒ ඒ අය කතා කරන්නේ තමන්ගේ ප්‍රදේශාට අනුව.ඒ ඒ ප්‍රදේශ එකිනෙකට වෙනස්.එනිසා මේදේ තමයි අපට කරන්න පුලුවන් එකම දේ කියලා මම කියනවා සභාපතිතුමණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

තව කාරණයක් සභාපතිතුමණි,වෙනදා දෙමව්පියන් එක්ක දරුවා ඉන්නවනම් දිවුරුම් සහතිකයක් මව හෝ පියා දුන්නහම ඒ ලකුණු 10 ලැබුණා.දැන් අද වෙලා තියෙන්නේ තාත්තා ,අම්මා හිටියත් ඔප්පුව නැතිනම් ලකුණු 06 ලැබෙන්නේ.අපේ සංස්කෘතියට අනුව දරුවෝ ඉල්ලන් නෑ ඔප්පු ලියලා දෙන්න කියලා.අද ඔප්පු ලියන්නත් ගාණක් ගෙවන්න වෙනවා.මං දන්න අයට මේ දේ වේලා තියෙනවා.මේකත් බරපතල ලෙස බලපානවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සරත් මන්ත්‍රීතුමත් දේව් මන්ත්‍රීතුමත් මේ ගැන අපට වඩා දන්නවා.ඇත්තටම කණගාටුදායක කරුණක් මේක.අම්බලන්ගොඩ නගරයේ ළමයෙක්ට ධර්මාශෝකය,දේවානන්ද,කුලරත්න වැනි ප්‍රසිද්ධ පාසලකට යාමේ අවස්ථාව නැති වේලා තියෙනවා.බොහොම හොද දෙයක් මේ උපත් විස්තර අපට ලබා දීපු එක සභාපතිතුමා.මේ සංඛ්‍යා ලේඛණ දිහා බැලුවම ළමයි 300 ක් විතර තමයි අම්බලන්ගොඩ ප්‍රදේශයේ 2014 වර්ෂයේ ඉපදිලා තියෙන්නේ.නමුත් අයදුම් පත් 2000 ක් විතර එනවා.විශේෂයෙන්ම තල්ගස්ගොඩ සුනාමී නිවාස 200ට වැඩියෙන් තියෙනවා.මොවුන්ට විශාල අසාධාරණයක් වෙනවා.ඔවුන් මේ ප්‍රදේශයේ හිටපු මිනිස්සු.ඉන්න තැනක් නැති නිසා තල්ගස්ගොඩ ප්‍රදේශයේ පදිංචි වේලා ඉන්නේ.අද සමහර ස්කෝලවල ඉන්ටවීවූ සඳහා ගියහම නගර සභාවේන් ඔප්පු ලබා දෙනවා කියලා දීපු ලියුම් විසි කරලා තියෙනවා.අපිව මේ වැසියන් විසින් පත් කරලා තියෙන්නේ මේ ප්‍රශ්න හොයන්න.එනිසා අපි මේකට මැදිහත් වෙමු සභාපතිතුමා.

<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා කතා කරමින්</u>

ඒ වගේම සභාපතිතුමා,ධර්මාශෝකය සහ දේවානන්දය ගත්තහම හෙප්පුමුල්ලට ළඟම ස්කෝල 2 ක.හෙප්පුමුල්ල ලඟ වුනාට බලපිටියේ ළමයි ධර්මාශෝකයට අහුවෙනවා.දැන් බැලුවහම අම්බලන්ගොඩ

නගරයට අයිති වෙනවා හෙප්පුමුල්ල ,බලපිටිය නගරයට අයිති වෙනවා කන්ද මාවත.කන්ද මාවත ළඟම ධර්මාශෝකයට.මෙහෙම බැලුවහම ධර්මාශෝකයෙනුත් 5 ක් කපනවා දේවානන්දෙනුත් 5 ක් කපනවා.ළමයි එළියේ.මේකට මොකක් හරි විසඳුමක් ගත යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>

අපි මේ සම්බන්ධයෙන් වසර 4 ක් තිස්සේ දිගින් දිගටම කතා කරනවා.මම කණගාටු වෙනවා ගිය වරත් අපි මේ දේ කතා කළත් අපට බැරි වුනා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමා හමු වෙන්න යන්න.උප සභාපතිතුමා කියන කාරණයත් එක්ක මමත් එකඟයි.පටබැඳිමුල්ල,හීරේවත්ත ප්‍රදේශ වලින් ගිහිපු අය තමයි දළුක්කන්ද ප්‍රදේශයේ ඉන්නේ.නමුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඉන්න නිළධාරීන් නීතිමය ගැටලු වලට ලක් වෙනවා මේ සම්බන්ධව කටයුතු කිරීමේදී.මම එක උදාහරණයක් කියන්නම්.මම ගිය වර ඇපිල්බෝඩ් එකේ ඉද්දී මම හොඳටම දන්නවා මේ පුද්ගලයා මේ ප්‍රදේශයේ නෙවෙයි කියලා.මෙතනදි මම විරුද්ධ වුණාම ,මට වුනේ උසාවියේදී ලැජ්ජා වෙන්න.මොකද ග්‍රාම සේවක සහතිකයක් දීලා තිබුණා උපන් දා සිට මේ ප්‍රදේශයේ මේ පුද්ගලයින් ඉන්නවා කියලා.සායනයට ගිහින් තියෙන්නෙත් වෙනත් ප්‍රදේශයක.මේ දේවල් ඉදිරිපත් කළත් උසාවියෙන් කීවේ ග්‍රාම සේවක කියනවනම් අපි එතනින් එහාට කොහොමද යන්නේ කියලා.අන්තිමට වුනේ පාසලට ඇතුලත් කර ගන්න කියලා නියෝගය ලේකම්තුමා විසින් එවලා තිබුණා.මේ වගේ ගැටලු තියෙනවා.ඒ වගේම කියන්න ඕන කිත්සිරි මන්ත්‍රීතුමා කීවා ආදී ශිෂ්‍ය සංගමයෙන් ගන්න එක නවත්තන්න ඕන කියලා.මෙහි නිර්දේශ කරලා තියෙනවා 50% ක් ආසන්නතාවයට,25% ක් ආදි ශිෂ්‍ය සංගමයට,15% ක් සහෝදර අනුග්‍රහයට,5% ක් ස්ථාන මාරුවීම් වලට,2% ක් අනධ්‍යයන කාර්යය මණ්ඩලයට තියෙනවා.විදේශගත වීම් වලටත් තියෙනවා.අපට මෙහිදී අදාල වෙන්නෙ ආසන්නනතාවය කියන කාරණය.ධර්මාශෝකයට ආසන්නතාවයට ගන්නෙ ළමයි 99 යි.සම්මුඛ පරීක්ෂණයෙන් 90 යි.ඇපිල් වලින් 9 යි.කුලරත්නේ මේක 50 වඩා අඩු සංඛ්‍යාවක්.ඒ වගේ මේ විද්‍යාල 4 ම ළමයි 300 ට අඩු සංඛ්‍යාවක් ඇතුලත් වෙන්නේ.300 ට වඩා ළමයි ඉපදිලා නම් තමයි ගැටලුව තියෙන්නේ.නමුත් ළමයි ඉපදෙන්නත් කලින් මිනිස්සු මේ ප්‍රදේශයේ කාමර අරගෙන ,ඉඩම් අරලෙන තියෙනවා.ඔවුන් පදිංචි නෑ.ඒත් ඔප්පුව තියෙනවා.බටපොල, ඇල්පිටිය,බේරුවල,අලුත්ගම ප්‍රදේශ වල අය මේ විදියට කරනවා.පළාත් පාලන ආයතනයක් ලෙස සහ මහජන නියෝජිතයින් ලෙස අපි යම් මැදිහත් වීමක් මේ සඳහා කළ යුතුමයි.මීටර 500 ක් වගේ කුඩා ප්‍රමාණයක පාසල් 4 ක් තියෙන එකම ප්‍රදේශය මෙය.මේක විශාල වශයෙන් බලපානවා මේ ගැටලුවට.මෙය වෙනත් කිසිම ප්‍රදේශයක නෑ.එනිසා අපි මෙය ඒත්තු ගන්වන්න ඕන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමාට.එනිසා මේ සඳහා දීර්ඝ දිනයක් ලබා නොගෙන ,මොකද 14,15.16.17 දින වල ඇපිල් බෝඩ් එක තියෙනවා ධර්මාශෝකයේ.ඡන්ද වැඩ කටයුතු නිසා මෙය ටිකක් ප්‍රමාද වුනත් හැකි ඉක්මණින් මේ සඳහා යම් ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමු කියලා මම ඉල්ලනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ලේකම්තුමා ,අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ කතා කරලා අපට මේ සඳහා ඉක්මණින්ම දිනයක් ලබා දෙන්න.

<u>තීරණය</u>

මහ අම්බලන්ගොඩ ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සලකා බැලූ ගරු සභාව අධ්‍යාපන අමාත්‍යංශ ලේකම් සමඟ මේ පිළිබඳ සාකච්ඡා කිරීමට දිනයක් යොදාගෙන සියලුම ගරු මන්ත්‍රීවරුන් ඒ සඳහා සහභාගී වීම සුදුසු බව තීරණය කරන ලද අතර මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යංශ ලේකම් සමඟ සාකච්ඡා කිරීමට සුදුසු දිනයක් යොදා ගන්නා ලෙස ලේකම් මහතාට වැඩි දුරටත් උපදෙස් ලබා දෙන ලදී.

12.23 “2015 වර්ෂය සඳහා අම්බලන්ගොඩ බස් නැවතුම්පල පොදු වැසිකිලිය බදු දීම” මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2015 වර්ෂය සඳහා බස් නැවතුම්පල පොදු වැසිකිලිය පී.අජිත් හේමන්ත මහතා විසින් බදු අයිතිය ලබා ගෙන ඇති බවත් දැනට වැසැකිළිය භාවිතා කිරීමට නොහැකි තත්වයේ පවතින බවත් එය තමන්ගේ පෞද්ගලික මුදලින් භාවිතයට සුදුසු අන්දමට ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වන බව පවසා ඇති බවත් ඒ සඳහා රු.169306.00 ක මුදලක් වැය වන බවත් 2015 වර්ෂයේ සිට ඉදිරියට වර්ෂ 5 ක් තමාට බදු අයිතිය ලබා දෙන ලෙස ඉල්ලා ඇති බවත් සඳහන් කර තිබුණි.

මේ සම්බන්ධ ප්‍රධාන ආදායම් නිළධාරිනියගේ නිර්දේශය පරිද ,බස් නැවතුමේ පොදු වැසිකිළිය දැනට භාවිතා කිරීමට නොහැකි තත්වයේ පවතින බවත් එය ප්‍රතිසංස්කරණය කිරීමට ඔහු විසින් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බවත් මින් ඉදිරියටද සියලු නඩත්තු කටයුතු ඔහු විසින් සිදු කළ යුතු බවත් ,බදුකරු විසින්ම මෙය නඩත්තු කරන බැවින් මෙම ගිවිසුමට යටත්ව වර්ෂයකට 5% ක වැඩිවීමේ පදනම මත වසර 05 ක කාලයක් මෙම වැසිකිලියේ බදු අයිතිය පී.අජිත් මහතාට පැවරීමට යෝජනා කර තිබුණි.

මේ සම්බන්ධ තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශයද වුයේ, බස් නැවතුම්පල පොදු වැසිකිලියේ ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම,කැඩී ඇති ටයිල් කොටස් සෑදීම,මුත්‍ර බඳුන් 03 ක් යෙදීම,කොමඩ් සෙට් 01 යෙදීම, දොරවල් සඳහා අගුලු යෙදීම,ටැප් ලයින් සැකසීම,අලුතින් ටාජ් යෙදීම,ස්කුවින් ෆෑන් 02 ක් යෙදීම,බිඩර් ෂවර් 02 ක් යෙදීම,මුහුණ සෝදන බේසම් යෙදීම ආදී කටයුතු සිදු කිරීමට පවතින බවත් මේ සඳහා රු.150000.00 ක පමණ මුදලක් වැය වන බවත් එම කයවුතු අත්‍යාවශ්‍ය සේවාවන් බවත් සඳහන් කර තිබූ අතර මීට පෙර අවස්ථා වලට වඩා හොඳ තත්වයෙන් වැසිකිළි පද්ධතිය පවත්වා ගෙන යන බවද සඳහන් කර තිබුණි.

<u>**තීරණය**</u>

ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පී.අජිත් හේමන්ත මහතාට අම්බලන්ගොඩ බස් නැවතුම්පල පොදු වැසිකිළය ප්‍රතිසංස්කරණය කිරීමට අවසර ලබා දීමටත් ,වසර 05 ක බදු අයිතිය වසරකට 5%ක වැඩි වීමේ පදනම මත ලබා දීමටත් ගරු සභාව තීරණය කරන ලදී.

12.24 “2015 අභ්‍යන්තර විගණන සැලැස්ම” මැයෙන් අභ්‍යන්තර විගණන නිළධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු විධිමත් පරිදි සිදු කිරීමට 2015 වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන සැලැස්ම ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**<u>තීරණය</u>**

ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් 2015 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

✪ fjk;a lreKq නැත

භාරත සමරසේකර,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව

**2015-01 - 28** වන දින
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.